ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

2019

වාර්ෂික වාර්තාව

ආරක්ෂක අමාත්‍යාංශය

පටුන

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය 3

විධායක වාර්තාව 4

දර්ශනය, මෙහෙවර හා ආයතනික අරමුණු 8

ජා. ගො. ප. සංවිධානයේ කළමනාකාරීත්වය 9

ආයතනික ව්‍යුහය 10

ජ්‍යෙෂ්ට කළමනාකාරීත්වය 10

වැදගත් සිදුවීම් 11

රාජ්‍ය ප්‍රතිපාදන යටතේ කරන ලද ව්‍යාපෘති 12

පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් 18

සමුළු 23

පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු 26

ප්‍රධාන උපදේශන ව්‍යාපෘති 29

අනෙකුත් ආදායම් උත්පාදක ක්‍රියාකාරකම් 30

විදේශීය සමඟ / ප්‍රදාන සහයෝගීතා ව්‍යාපෘති 31

ජා. ගො. ප. සංවිධානයෙහි ප්‍රකාශන 35

මූල්‍යමය තත්ත්වය පිලිබඳ වැදගත් කරුණු 36

මූල්‍යමය තත්ත්ව ප්‍රකාශය 37

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 38

මුදල් ප්‍රවාහ ප්‍රකාශය 39

ගිණුම් සටහන් 40

මානව සම්පත් කළමනාකරණය /ධාරිතා සංවර්ධනය 41

2019 වර්ෂය සඳහා වූ විගණන වාර්තාව 45

2019 වාර්ෂික වාර්තාව ජා. ගො. ප. සංවිධානයේ අන්තර් කළමනාකරණ කමිටුව (IMC) විසින් 2020 පෙබරවාරි 24 වන දින පැවති රැස්වීමේ දී අනුමත කරන ලදී

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය 1983 වර්ෂයේ සැප්තැම්බර් 29 වන දින ගනුලැබූ කැබිනට් තීරණයක් මත 1984 මාර්තු 5 වන දින ස්ථාපනය කරනලදි. වසර 36 කට ආසන්න කාලයට පසු, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මේ වන විට ප්‍රමුඛ පර්යේෂණ හා සංවර්ධන ආයතනයක්, කීර්තිමත් තාක්ෂණික සේවා සැපයුම්කරුවෙකු මෙන්ම නායයෑම් අවදානම් කළමනාකරණය සඳහා වූ ජාතික කේන්ද්‍රස්ථානය ලෙසටද පත්ව ඇත.

විවිධ විෂය ක්ෂේත්‍ර වල ප්‍රවීණයන් එක්ව පර්යේෂණ සහ සංවර්ධන සේවා ද, තාක්ෂණික සහ උපදේශන සේවා ද සපයනු ලබන ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සැබෑ බහුශික්ෂණ ආයතනයක් ලෙස කටයුතු කරයි. ගොඩනැගිලි ද්‍රව්‍ය පර්යේෂණ හා පරීක්ෂණ අංශය, පරිසර අධ්‍යයන හා සේවා අංශය, භූ තාක්ෂණ ඉංජිනේරු අංශය, මානව ජනාවාස සැලසුම් අංශය, නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමනාකරණ අංශය සහ ව්‍යාපෘති කළමනාකරණ අංශය වශයෙන් තාක්ෂණික අංශ හයකින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සමන්විත වේ. මීට අමතරව එය පරිපාලන අංශයකින් ද, මූල්‍ය අංශයකින් ද, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික වැඩසටහන් අංශයකින් ද, අභ්‍යන්තර විගණන අංශයකින් ද සමන්විත වේ.

කඳු නායයෑම්, මෘදු භූමි, දූෂිත වාතය, අපවිත්‍ර ජලය, දුර්වල ඉදිකිරීම් හා ප්‍රමිතියෙන් තොර ගොඩනැගිලි ද්‍රව්‍ය ආදී ජීවත් වන පරිසරයේ විවිධ ගැටළු පැණ නගින විට ජනතාව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ සහාය අපේක්ෂා කරයි. වගකිවයුතු සේවා සපයන ආයතනයක් ලෙස සියලුම පුරවැසියන්ගේ ජීවන තත්ත්වය පවත්වා ගැනීම හා වැඩිදියුණු කිරීම සඳහා සුදුසු විසඳුම් සැපයීමට ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය සෑම විටම සූදානම් ව සිටියි.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් නාය අවදානම සහිත ස්ථාන හඳුනා ගැනීම, අවදානම ඇගැයීම, නායයෑම් උවදුරු සිතියම්ගතකරණය, නායයෑම් පූර්ව අනතුරු ඇඟවීම, දැනුවත් කිරීම සහ නායයෑම් අවම කිරීම යන කටයුතු සිදු කෙරේ. ඊට අමතරව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් රටේ නායයෑම් ඇතිවිය හැකි ප්‍රදේශවල ඉදිකිරීම් සහ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා නායයෑම අවදානම් අගැයීමේ වාර්තා ද නිකුත් කරනු ලැබේ.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය තම පුනරාවර්තන වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත් ආදායමක් උපයා යැපෙන ආයතනයක් වන අතර සාමාන්‍ය මහජනතාව, රාජ්‍ය අංශයේ ආයතන, පුද්ගලික සමාගම් සහ ජාත්‍යන්තර ආයතන සඳහා පරීක්ෂණ සහ තාක්ෂණික උපදේශන සේවා ලබා දෙයි. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය එහි අංග සම්පූර්ණ පාංශු පරීක්ෂණ විද්‍යාගාරයේ හා භූ විදුම් උපකරණ වල සහයෙන් උපදේශන සේවාවක් ලෙස භූ තාක්ෂණික ඉංජිනේරු පරීක්ෂණ සිදු කරන අතර දිවයිනේ ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධනය සහ නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘති සඳහා භූ තාක්‍ෂණික විමර්ශන සිදු කර ඇත. ඊට අමතරව, ඉදිකිරීම් හා සහතික කිරීමේ යෝග්‍යතාව සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය පරීක්ෂා කිරීම, ආපදා අවදානම් තක්සේරුකරණය, ප්‍රජාවන්ගේ මෙන් ම පරිසරයේ සුරක්ෂිතතාව තහවුරු කරමින් ජලය, අපජලය, පස, රොන්මඩ, වාතය යන මේවායෙහි ගුණාත්මක භාවය තක්සේරුකරණය සහ අව බලපෑම් අධ්‍යයන සහ තත්ත්ව කළමනාකරණය හා සම්බන්ධ අධ්‍යයනයන්, තාක්ෂණික උපදේශන සේවා ලෙස ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ලබාදෙන්නේ ඊට අවශ්‍ය කෙරෙන ආදායම උපයාගනිමිනි. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ව්‍යාපෘති කළමනාකරණය සඳහා ද උපදේශන සේවා ලබා දෙන අතරම හානියට පත් හා පැරණි ගොඩනැගිලිවල තත්වය වාර්තාකර්ණය සිදු කරමින් සුවිශේෂී සේවාවක නිරත වෙයි. මානව ජනාවාස සැලසුම්කරණය හා ලාභදායී ආපදා ප්‍රත්‍යස්ථ නිවාස ප්‍රවර්ධනය කිරීම ද ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් සපයනු ලබන තවත් ප්‍රධාන උපදේශන සේවාවක් වේ.

විධායක වාර්තාව

ප්‍රමුඛ හා කාර්යක්ෂම රාජ්‍ය ආයතනයක් ලෙස ජා. ගො. ප. සංවිධානය අඛණ්ඩව පෙරමුණ ගෙන කටයුතු කරන අතර ම සිය යුතුකම් හා වගකීම් පූර්ණ ලෙස හා උපරිමයෙන් ඉටු කරයි. වරින් වර මුහුණ දෙන අභියෝග මධ්‍යයේ වුවද, ජා. ගො. ප. සංවිධානය වෙත පැවරුණු වගකීම් නිසි පරිදි ඉටු කරමින් මූල්‍ය ම ය වශයෙන් ආයතනික ස්ථාවරත්වය සහතික කරන ලදී. එබැවින් 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ජා. ගො. ප. සංවිධානයෙහි වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශය සම්පාදනය කර ඉදිරිපත් කිරීමට ලැබීම මා ලද භාග්‍යයක් ලෙස සලකමි.

ආපදා අවදානම් අවම කිරීමේ පියවර ලෙස ජා. ගො. ප. සංවිධානය ප්‍රධාන ව්‍යාපෘති කිහිපයක් 2018 දී ආරම්භ කල අතර ඒවා 2019 දී ක්‍රියාත්මක විය. ජා. ගො. ප. සංවිධානය ඉදිරි වසර 2, 3 දක්වා කාලය තුළ මෙම ව්‍යාපෘති නිම කිරීමට සැලසුම් කර ඇත. ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ (AIIB) මූල්‍ය පහසුකම් යටතේ ස්ථායීකරණ ක්‍රමවේද මගින් නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය ජා. ගො. ප. සංවිධානය විසින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇති දැවැන්ත ව්‍යාපෘතියකි. ආපදාවෙන් පීඩාවට පත් පවුල් නැවත පදිංචි කිරීම තවත් ප්‍රධාන ව්‍යාපෘතියකි. ජා. ගො. ප. සංවිධානය කරගෙන යනු ලබන මෙම ව්‍යාපෘති මඟින් වාර්ෂික පිරිවැටුම බොහෝ ගුණයකින් වැඩි කරනු ලබන අතර ආයතනය වඩා ඉහළ ක්‍රියාකාරිත්වයකට ගෙන යනු ලැබේ.

2019 වර්ෂයේ දී ජා. ගො. ප. සංවිධානය රු. මිලියන 959.0 ක ඉහළ පිරිවැටුමක් වාර්තා කළ අතර දැඩි තරඟකාරිත්වයක් තිබියදීත්, පරීක්ෂණ සහ උපදේශන සේවා සඳහා තරඟකාරී ආයතනවලට මුහුණ දෙන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස රු. මිලියන 55.2 ලාභයක් උපයන ලදී.

ජා. ගො. ප. සංවිධානය පාරිභෝගිකයින්ට වඩා හොඳ සේවාවක් සැපයීම සඳහා තාක්ෂණික උපදේශන සේවා අඛණ්ඩ ව ඉහල නැංවීය. තාක්ෂණික උපදේශන සහ පරීක්ෂණ සේවා ලබා ගැනීමේ දී පෞද්ගලික ආයතන සහ අනෙකුත් තරඟකාරී රාජ්‍ය ආයතන සමඟ දැඩි තරඟකාරිත්වයකින් කටයුතු කිරීමට සිදුවිය. පරීක්ෂණ සහ උපදේශන කටයුතු සැපයීමෙන් ලැබූ මුළු ආදායම රු. මිලියන 618.8 කි.

තාක්ෂණික උපදේශන සහ පරීක්ෂණ කටයුතු ප්‍රමිතියකින් යුතුව නිසි කලට ලබා දීමට ජා. ගො. ප. සංවිධානය සමත් විය. තරඟකාරී කොන්ත්‍රාත්තු ලබා ගැනීමේ දී සැමවිටම ජා. ගො. ප. සංවිධානයට ප්‍රමුඛ ස්ථානයක් ලබා දෙන බව පෙනේ. තවද, උසස් ප්‍රමිතීන් පවත්වා ගැනීමේ පියවරක් ලෙස, ජා. ගො. ප. සංවිධානයේ පවතින විද්‍යාගාර තුනම ISO 17025 යටතේ ප්‍රතීතන තත්ත්වය ලබා ඇති අතර සියළුම අභ්‍යන්තර හා බාහිර විගණනයන් නියමිත වේලාවට අඛණ්ඩව කරගෙන යමින් කාර්ය මණ්ඩලය සඳහා තවදුරටත් පුහුණු වැඩසටහන් ලබාදෙනු ලැබේ.

ජා. ගො. ප. සංවිධානය සහතික කිරීමේ ආයතනයක් ලෙස **ISO 17065** යටතේ සහ පරීක්ෂණ ආයතනයක් ලෙස **ISO 17020** යටතේ ප්‍රතීතනය කිරීම තුළින් තත්ත්ව කළමනාකරණයේ විෂය පථය පුළුල් කිරීමට තවදුරටත් අපේක්ෂා කරයි. එවැනි ප්‍රතීතනය සඳහා මූලික කටයුතු ජා. ගො. ප. සංවිධානය විසින් ආරම්භ කර ඇති අතර ක්ෂේත්‍රයේ අනාගත ගනුදෙනුකාර ආයතන දැනුවත් කර ඇත.

කාර්යයභාරයන් වැඩිවීම නිසා අනුමත කාර්ය මණ්ඩලයන් බඳවා ගැනීමට අවශ්‍යවූ අතර කරගෙන යනු ලබන ව්‍යාපෘතිවල අවශ්‍යතා අනුව තවදුරටත් කාර්ය මණ්ඩලයන් බඳවා ගන්නා ලදී. 2019 දෙසැම්බර් මස අවසානය වන විට කාර්ය මණ්ඩලය 483 සිට 490 දක්වා ඉහළ නැංවූ අතර එය ජා. ගො. ප. සංවිධානය හි සමස්ත කාර්ය මණ්ඩලයෙන් වාර්තා වූ වැඩිම සංඛ්‍යාව වේ.

2019 වර්ෂයේ දී ද අඛණ්ඩව රැකියා සුරක්ෂිතතාවය සඳහා ප්‍රමුඛතාවය ජා. ගො. ප. සංවිධානය විසින් ලබා දීම නිසා එහි කාර්යාල, රසායනාගාර සහ වැඩබිම්වල අනතුරු සහ හදිසි අවස්ථා ඉතා අඩු විය. පුද්ගල ආරක්ෂණ උපකරණ පැළඳීම සහ වැඩ කිරීමේ දී වෙනත් ආරක්ෂක උපකරණ භාවිතා කිරීම ජා. ගො. ප. සංවිධානයේ කාර්ය මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ. මෙමඟින් ඉහළ මට්ටමේ රැකවරණයක් පවත්වා ගැනීමට සැම විටම උත්සාහ කරනු ලැබේ.

ජා. ගො. ප. සංවිධානය විසින් පාර්ශවකරුවන් සමඟ ඔවුන්ගේ පර්යේෂණ අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා

කර්මාන්ත උපදේශන රැස්වීමක් පවත්වනු ලැබූ අතර එම අවශ්‍යතා පර්යේෂණ හා සංවර්ධන වැඩසටහනට ඇතුළත් කර ඇත. 2019 දී ජා. ගො. ප. සංවිධානය වෙත පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන සඳහා භාවිතා කිරීමට රජයේ පර්යේෂණ ප්‍රතිපාදන ලෙස රු. මිලියන 15.0 ලැබුණි. රු. මිලියන 25.0 රසායනාගාර හා ක්ෂේත්‍ර උපකරණ මිලදී ගැනීම සඳහා ලැබුණි. පර්යේෂණ හා සංවර්ධන අධ්‍යයන පුළුල් පරාසයක විෂය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි සිදු කරන ලද අතර පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන යටතේ විස්තර මෙම වාර්තාවේ දක්වා ඇත.

ආපදා තත්වයට ඔරොත්තු දෙන ඉදිකිරීම් පිළිබඳව රාජ්‍ය නිලධාරීන්, නැවත පදිංචි කිරීමේ වැඩසටහන්වල නිවාස ලාභීන්, ඉදිකිරීම් නිලධාරීන්, පාසල් හා විශ්ව විද්‍යාල සිසුන් සහ පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධානවල නිලධාරීන් දැනුවත් කිරීම සඳහා ජා. ගො. ප. සංවිධානය විසින් 2019 දී පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් රාශියක් පවත්වන ලදී.

ජාතික සංවර්ධනය සඳහා දායකත්වය

නායයෑම් අධ්‍යයන සඳහා ජාතික කේන්ද්‍රස්ථානය ලෙස ජා. ගො. ප. සංවිධානය වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. උපද්‍රව සහ අවදානම් සිතියම් පිළියෙල කර ඇති අතර ඒවා ජාතික භෞතික සැළසුම් හා සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා යොදා ගෙන ඇත. පූර්ව අනතුරු ඇඟවීම නිකුත් කිරීම ජා. ගො. ප. සංවිධානය විසින් ඉටු කරනු ලබන ඉතා වැදගත් රාජකාරියකි.

නායයෑමේ අවදානමක් ඇති ප්‍රදේශවල ඉදිකිරීම් හෝ සංවර්ධන කටයුතු සඳහා අනුමැතිය ලබා දීම සඳහා පළාත් පාලන ආයතන වෙත තාක්ෂණික නිර්දේශ සහිතව නායයෑම් අවදානම් තක්සේරු වාර්තා (LRAR) ලබාදීම ජා. ගො. ප. සංවිධානය වෙත පවරා ඇත. 2019 දී නායයෑමට ලක්විය හැකි දිස්ත්‍රික්ක ලෙස තවත් දිස්ත්‍රික්ක 4 ක් ප්‍රකාශයට පත් කොට කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඒ අනුව මුළු නායයෑමට ලක්විය හැකි දිස්ත්‍රික්ක 14 ක් විය. මෙම වාර්තා නිකුත් කරන දිස්ත්‍රික් කාර්යාල 10 ක් ජා. ගො. ප. සංවිධානය සතුව ඇත. 2019 දී එවැනි වාර්තා 7601 ක් නිකුත් කරන ලදී.

2019 වර්ෂයේ දී ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (JICA), ලෝක බැංකුව, ආසියානු ආපදා පෙර සූදානම් මධ්‍යස්ථානය (ADPC), නෝර්වීජියානු භූ තාක්ෂණික ආයතනය (NGI) සහ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) ජා. ගො. ප. සංවිධානය වෙත අඛණ්ඩව සිය ආධාර ලබා දී ඇත. එක්සත් ජනපද භූ විද්‍යා සංගමය, බාත් විශ්ව විද්‍යාලය සහ සල්ෆර්ඩ් විශ්ව විද්‍යාලය වැනි තවත් ආයතන ජා. ගො. ප. සංවිධානය වෙත ඔවුන්ගේ සහාය ලබා දුන් අතර මේ සඳහා අවබෝධතා ගිවිසුම් අත්සන් කරන ලදී.

ජා. ගො. ප. සංවිධානය විසින් නායයෑම් අවම කිරීමේ කටයුතු අඛණ්ඩ ව ක්‍රියාත්මක කරනු ලැබේ. ජනාවාසවලට තර්ජනයක් විය හැකි අනතුරුදායක නායයෑම් අවම කිරීම සහ මහාමාර්ග දෙපස බෑවුම් ස්ථාවර කිරීම, දුම්රිය මාර්ග හා පාසල් අවට බෑවුම් සහ අවදානමට ලක්විය හැකි පොදු ගොඩනැගිලි අසල අස්ථායී බෑවුම් මෙම කාර්යය සඳහා හඳුනාගෙන ඇත.

හදිසි ආපදා ප්‍රතිචාර සඳහා සහ ආයතනික සමාජ වගකීමක් ලෙස මහජනතාව දැනුවත් කිරීමේ කටයුතු සඳහා ජා. ගො. ප. සංවිධානය තමන්ගේම අතිරික්ත අරමුදලින් කොටසක් ආයෝජනය කර ඇත.

ජා. ගො. ප. සංවිධානයේ විශේෂඥතා දැනුම පුළුල් කිරීම

අස්ථාවර වූ මීතොටමුල්ල කසල රඳවනය ස්ථාවර කිරීම මඟින් විනෝදාත්මක උද්‍යානයක් බවට පරිවර්තනය කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට ජා. ගො. ප. සංවිධානය සිය තාක්ෂණික සේවාවන් සපයන ලදී. Geo-textile ස්ථර ඇතිරුම්, ක්ෂරිත නිස්සාරක නල සහ වාතාශ්‍ර කවුලු ස්ථාපිත කිරීම සඳහා තාක්ෂණික උපදේශනය ලබා දෙන ලදී.

ලෝක බැංකුවේ දේශගුණික අවබලපෑම් අවම කිරීමේ වැඩසටහන (CRIP) සහ ජයිකා ආධාර යටතේ නායයෑම් ආපදා ආරක්ෂණ ව්‍යාපෘතිය (LDPP) යටතේ මහනුවර - මහියංගන මාර්ගයේ සහ අනෙකුත් ප්‍රධාන මාර්ග ජාලයන්හි අස්ථාවර බෑවුම් ස්ථාවර කිරීම සඳහා ජා. ගො. ප. සංවිධානය සිය තාක්ෂණික සහාය ලබා දීම අඛණ්ඩ ව සිදු කළේය.

මෑතදී ඇති වූ නායයෑම් හා ගංවතුර ආපදාවන්ට ගොදුරුවූවන් සහ ඉහළ ආපදා අවදානමක් ඇති ප්‍රදේශවල වෙසෙන පුද්ගලයින් ආරක්ෂිත ප්‍රදේශවල ආපදා තත්වයට ඔරොත්තු දෙන ජනාවාසවල නැවත පදිංචි කිරීමට රජය තීරණය කර ඇත. වෙනත් ආයතන විසින් ක්‍රියාත්මක කරන ලද නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘති සඳහා ජා. ගො. ප. සංවිධානය අඛණ්ඩ ව සහාය වූ අතර ඊට අමතරව, ජා. ගො. ප. සංවිධානය විසින්ම කළුතර සහ රත්නපුර දිස්ත්‍රික්කවල නැවත පදිංචි කිරීමේ විශාල ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී.

ආදායම

ජා. ගො. ප. සංවිධානය එහි පුනරාවර්තන වියදම් ප්‍රධාන වශයෙන් සපුරා ගන්නේ රාජ්‍ය හා පෞද්ගලික අංශ සඳහා ලබා දෙන උපදේශන සහ පරීක්ෂණ සේවා සැපයීමෙනි. ඊට අමතර ව, අවම කිරීමේ ව්‍යාපෘති,



පසුගිය වසර 5 සඳහා මුළු මෙහෙයුම් ආදායම



පසගිය වසර 5 හි වාර්තාගත ලාභය



ව්‍යාපෘති සඳහා ලද රජයේ ප්‍රතිපාදන – 2019

ආපදා සිතියම්ගත කිරීම, විශේෂ නායයෑම් පරීක්ෂණ සහ රජය මඟින් සිදුකරනු ලබන වෙනත් ව්‍යාපෘතිවලින් ජා. ගො. ප. සංවිධානය වෙත අරමුදල් ලැබේ.

2010 සිට සෑම වසරකම ශුද්ධ ලාභයක් උපයා ගැනීමට ජා. ගො. ප. සංවිධානය සමත් වී තිබේ.

බාධක

හඳුනාගත් බාධක පහත දැක්වේ.

- ජා. ගො. ප. සංවිධානය පනතක් තවමත් ස්ථාපිත කර නොමැත.
- ජා. ගො. ප. සංවිධානය රජයේ ආයතනයක් වීම නිසා තරඟකාරී ලෙසින් උපදේශන සඳහා ලංසු තැබීමේ දී ඉතා දුෂ්කරතාවයන්ට පත්වීම.
- ජා. ගො. ප. සංවිධානයේ කාර්ය මණ්ඩලය දීර්ඝ සේවා පැය ගණනක නිරත වුවද ගෙවීම් කිරී සීමා කර ඇත.

ඵලදායිතාව වැඩිදියුණුකිරීම සඳහා වූ පියවර

2019 වර්ෂය තුළ ආයතනික කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත.

- ✓ විද්‍යාගාර තුනම ප්‍රතීතනය ලබාගෙන ක්‍රියාත්මක කර ඇත.
- ✓ තාක්ෂණික සහයෝගීතා ව්‍යාපෘති යටතේ තාක්ෂණික ධාරිතාව ඉහළ නැංවීම සඳහා ජා. ගො. ප. සංවිධානය වෙත නොකඩවා ආධාර ලැබුණි.
- ✓ නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘති සඳහා ජා. ගො. ප. සංවිධානයෙ හි සැලසුම් ඒකකය දායකත්වය ලබාදෙයි.
- ✓ උස් ගොඩනැගිලි සහ ගොඩනැගිලි සංකීර්ණ ඉදිකිරීමේ දී යාබද දේපලවල ආරක්ෂාව සඳහා ඇතිවිය හැකි බාධාවන් අවමකිරීම සහතික කිරීම සඳහා හු තාක්‍ෂණික අවදානම් ඇගැයීම පිණිස ජා. ගො. ප. සංවිධානයේ ධාරිතාව වැඩි දියුණු කිරීමට කටයුතු කර ඇත.

අනාගත සැළසුම්

- ➤ මේවනවිට දිස්ත්‍රික් කාර්යාල කුලී ගොඩනැගිලිවල පවත්වාගෙන යන බැවින් නව කාර්යාල ඉදිකිරීමට සැලසුම් කර ඇත.
- ➤ උපද්‍රව සිතියම් සහ අවදානම් පැතිකඩ සකස් කිරීම වේගවත් කිරීම සඳහා සැලසුම් සකස් කර ඇත.
- ➤ ජා. ගො. ප. සංවිධානය විසින් රජයේ අරමුදල් සහිත ව්‍යාපෘතියක් ලෙස පොදු ගොඩනැගිලිවල තත්ත්ව තක්සේරු කිරීම තවදුරටත් සිදු කරනු ලැබේ.
- ➤ ජා. ගො. ප. සංවිධානය විසින් ශ්‍රී ලංකාවේ රසායනික උපද්‍රව කළමනාකරණය පිළිබඳ අධ්‍යයන තවදුරටත් සිදුකරනු ලැබේ.
- ➤ ඉදිකිරීම් කර්මාන්තයට මෑතකදී සකස් කරන ලද මාර්ගෝපදේශ ජා. ගො. ප. සංවිධානය විසින් තවදුරටත් හඳුන්වා දෙනු ඇත.
- ➤ ජයිකා ආධාරයෙන් TCLMP - II අදියර හරහා නායයෑම් අවම කිරීම හා ඒ හා සම්බන්ධ ධාරිතාව ඉහළ නැංවීම ජා. ගො. ප. සංවිධානය අපේක්ෂා කරයි.

කෘතවේදීත්වය

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ මෙම සාර්ථකත්වය උදෙසා මාර්ගෝපදේශනය හා මග පෙන්වීම ලබා දුන් ගරු. රාජ්‍ය ආරක්ෂක අමාත්‍ය චමල් රාජපක්ෂ, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් මේජර් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න සහ ජා. ගො. ප. සංවිධානයේ අතුරු කළමනාකරණ කමිටුවේ (IMC) සභාපතිතුමා වෙත ස්තුති කිරීමට මම මෙය අවස්ථාවක් කරගනිමි.

තවද, ජා. ගො. ප. සංවිධානය, අන්තර් කළමනාකරණ කමිටුව සහ විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්, අයවැය දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය, ජාතික සැළසුම් දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව අධ්‍යක්ෂ ජනරාල්වරුන් වෙත ද ජාතික ආපදා සහ සේවා මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂකවරයා වෙත ද මගේ කෘතඥතාවය පළ කිරීමට කැමැත්තෙමි.

මේ අවස්ථාවේදී අපගේ ජාත්‍යන්තර පාර්ශ්වකාර ආයතන වන ලෝක බැංකුව, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP), JICA ආයතනය, ආසියානු ආපදා පෙරසූදානම් මධ්‍යස්ථානය (ADPC), නෝර්වීජියානු භූ තාක්ෂණික ආයතනය (NGI), ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) සහ එක්සත් ජනපද භූ විද්‍යා සමීක්ෂණ ආයතනය (USGS) වෙත විවිධ ව්‍යාපෘති හා වැඩසටහන් සඳහා තාක්ෂණික හා මූල්‍ය ආධාර සැපයීම පිළිබඳව කෘතවේදීතාවය පිරිනමනු ලැබේ.

සියල්ලටම වඩා, අපගේ කාර්යසාධනයේ විශිෂ්ටත්වයට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ කොඳු නාරටියවන කාර්යය මණ්ඩලය හා ඔවුන්ගේ දැනුම, හැකියා සහ වෘත්තීයවේදීන් හේතු විය.

ඉදිරි වර්ෂවල දී ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ කාර්යසාධනය තවදුරටත් වැඩිදියුණු කිරීමට සහ අපගේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මඟින් සකස්කර ඇති මෙහෙවර සහ අරමුණු ඉටුකර ගැනීම සඳහා අපි නිරන්තරව සහයෝගයෙන් කටයුතු කරන්නෙමු. අපගේ සාමාජිකයින් අදහස් හුවමාරුකර ගැනීමේදී හා විශිෂ්ට ප්‍රතිඵල ලබා ගැනීම සඳහා කටයුතු කිරීමේ දී කණ්ඩායම් සමඟ සහයෝගී ව කටයුතු කරන බව අපි උදක් ම විශ්වාස කරමු.

ඉංජිනේරු (ආචාර්ය) ආසිරි කරුණාවර්ධන
අධ්‍යක්ෂ ජනරාල්

දර්ශනය, මෙහෙවර හා ආයතනික අරමුණු

දැක්ම

"වඩා සුරක්ෂිත නිර්මිත පරිසරයක් උදෙසා"

මෙහෙවර

ආපදා අවදානම අඩු කිරීමට සහ සුරක්ෂිත නිර්මිත පරිසරයක් උදෙසා පර්යේෂණ, සංවර්ධන සහ තාක්ෂණික සේවාවන් පවත්වා ගැනීම සහ වැඩි දියුණු කිරීම

ආයතනික අරමුණු

- ආපදාවලට ඔරොත්තු දීමේ සහ ආපදා අවදානම අවම කිරීමේ ජාතික නියමුවෙකු බවට පත්වීම
- තාක්ෂණික අංශයේ ප්‍රවීණ ආයතනයක් බවට පත්වීම
- විශිෂ්ට තාක්‍ෂණික සේවා මධ්‍යස්ථානයක් වීම
- නායයෑම් සහ ඒ ආශ්‍රිත භූ ආපදා හා සම්බන්ධ ජාතික මධ්‍යස්ථානය ලෙස අධි කාර්යසාධනයක් සහිත වීම
- තාක්‍ෂණික තොරතුරු සැපයීමේ මධ්‍යස්ථානයක් ලෙස අඛණ්ඩ ව ඉදිරියට යාම

ජා. ගො. ප. සංවිධානයේ කළමනාකාරීත්වය

විෂයභාර අමාත්‍යවරයා

ගරු චමල් රාජපක්ෂ මහතා
ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය

වර්තමානයේ දී ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ පරිපාලන, මූල්‍ය හා කළමනාකරණ කටයුතු මෙහෙයවීමට සහ මාර්ගෝපදේශකත්වය සැපයීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම් සභාපතීත්වය දරණ කැබිනට් අනුමැතිය ලත් අන්තර් කළමනාකරණ කමිටුවක් පත්කර ඇත.

අන්තර්වාර කළමනාකරණ කමිටුව (IMC)

මේජර් ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න (සභාපති) ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය	**ඉංජිනේරු (ආචාර්ය) ආසිරි කරුණාවර්ධන** අධ්‍යක්ෂ ජනරාල් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
ඩබ්. ඒ. ධර්මසිරි මයා අධ්‍යක්ෂ ජනරාල් ආපදා සහනසේවා මධ්‍යස්ථානය	**සමන්ති මීතලාව මහත්මිය** අධ්‍යක්ෂ ජාතික අයවැය දෙපාර්තමේන්තුව
ඉංජිනේරු සී. ඩී. ඩබ්. අලහකොන් මයා අතිරේක ලේකම් (තාක්ෂණික) නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය	**එච්. යූ. ආර්. ෆොන්සේකා මයා** ප්‍රධාන ගණකාධිකාරී ආපදා කළමනාකරණ අංශය
ඒ. කේ. කරුණානායක මයා අධ්‍යක්ෂ ජනරාල් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව	**එච්. කේ. බාලචන්ද්‍ර මයා** අධ්‍යක්ෂ ජනරාල් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

විගණන හා කළමනාකරණ කමිටුව

සමන්ති මීතලාව මහත්මිය අධ්‍යක්ෂ ජාතික අයවැය දෙපාර්තමේන්තුව	**ආර්. ඒ. එන්. ඩී. රණතුංග මහත්මිය** ප්‍රධාන අභ්‍යන්තර විගණක ආපදා කළමනාකරණ අංශය
එච්. කේ. බාලචන්ද්‍ර මයා අධ්‍යක්ෂ ජනරාල් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය	**ඒ. බී. ආර්. අමරකෝන් මහත්මිය** විගණන අධිකාරී රාජ්‍ය විගණන අංශය
ඉංජිනේරු (ආචාර්ය) ආසිරි කරුණාවර්ධන අධ්‍යක්ෂ ජනරාල් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය	**කුමුදු රත්දෙනි මහත්මිය** අධ්‍යක්ෂ (මූල්‍ය) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

එච්. එල්. රුවන්තිලක මයා
අභ්‍යන්තර විගණක
ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

ආයතනික ව්‍යුහය



ජ්‍යෙෂ්ට කළමනාකාරීත්වය

ඉංජිනේරු (ආචාර්ය) ආසිරි කරුණාවර්ධන	**අධ්‍යක්ෂ ජනරාල්**
කේ. සී. සුගතපාල මයා	අධ්‍යක්ෂ, මානව ජනාවාස සැලසුම්කරණය හා පුහුණු අංශය
සර්ධානි වී. ඩයස් මිය	අධ්‍යක්ෂ, පාරිසරික අධ්‍යයන හා සේවා අංශය
කිත්සිරි එන්. බණ්ඩාර මයා	අධ්‍යක්ෂ, භූ තාක්ෂණික ඉංජිනේරු හා පරීක්ෂණ අංශය
සුනේත්‍රා මුතුරත්න මිය	අධ්‍යක්ෂ, ගොඩනැගිලි ද්‍රව්‍ය පර්යේෂණ හා පරීක්ෂණ අංශය
ජේ. කුමුදුණී ජයවර්ධන මිය	අධ්‍යක්ෂ, ව්‍යාපෘති කළමනාකරණ අංශය
ආචාර්ය ගාමිණී ජයතිස්ස මයා	වැ. බ. අධ්‍යක්ෂ, නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමනාකරණ අංශය
කුමුදු රත්දෙනිය මිය	අධ්‍යක්ෂ, මූල්‍ය
සරත් කුරේ මයා	වැ. බ. අධ්‍යක්ෂ, පරිපාලන

වැදගත් සිදුවීම්

2019 වර්ෂයේ දී, කළුතර සහ රත්නපුර දිස්ත්‍රික්කවල ආපදා අවතැන් වූ පවුල් නැවත පදිංචි කරවීම සඳහා පෙරසවි කොන්ක්‍රීට් පැනල නිර්මිත නිවාස ඉදිකිරීම සඳහා රජය විසින් අරමුදල් සපයන ව්‍යාපෘතියක් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO) විසින් ආරම්භ කර ඇත. මීට අමතරව, 2018 දී ආරම්භ කරන ලද නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය මගින් ද ප්‍රගතියක් ලබා ඇත. ජා. ගො. ප. සංවිධානය විසින් ආසියානු ආපදා පෙර සූදානම් මධ්‍යස්ථානය සමඟ සොබාදහම පදනම් කරගත් නායයෑම් අවදානම් කළමනාකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළ අතර ආයතනික ධාරිතාවය ශක්තිමත් කිරීම සඳහා ජාත්‍යන්තර ආයතන කිහිපයක් (SATREPS, NILIM, SABO සහ USGS) සමඟ තාක්‍ෂණික සහයෝගීතාවයන් තවදුරටත් වර්ධනය කරන ලදී. වැඩිදියුණු කළ ස්වයංක්‍රීය වර්ෂා මාපක සහ භූමි උපකරණ ජාලයේ සහාය ඇතිව නායයෑම් පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පූර්ව අනතුරු ඇඟවීම් ඵලදායී ලෙස ලබා දී ඇත. ජා. ගො. ප. සංවිධානයේ පර්යේෂණ සම්මන්ත්‍රණය 2019 දෙසැම්බර් මාසයේ දී 10 වන වරටත් පවත්වන ලදී.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය රේඛීය අමාත්‍යාංශයේ එකම තාක්ෂණික සහ පර්යේෂණ ආයතනය ද වේ. විවිධ අංශවල බහුවිධ විශේෂඥ ඥානය සහ නවීන තාක්‍ෂණය යොදා ගනිමින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය රටෙහි පවතින බොහෝ තාක්ෂණික ගැටළු සඳහා විසඳුම් ලබා දීමට සමත්ව ඇත. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, මේවන විට භූ තාක්ෂණික ඉංජිනේරු කාර්යයන්, ගොඩනැගිලි ද්‍රව්‍ය තාක්ෂණය, මානව ජනාවාස සැලසුම්, පාරිසරික කළමනාකරණය සහ ව්‍යාපෘති කළමනාකරණය යන ක්ෂේත්‍ර සඳහා තාක්ෂණික සේවා ලබා දේ. එමෙන්ම විශේෂ ක්ෂේත්‍රයන්වන, නායයාම අවම කිරීම, භූමිය ගිලාබැසීම්, ආපදා ප්‍රත්‍යාස්ථිතිය සහ නියඟයට අනුවර්තනය වීම වැනි වෙනත් ආයතනවල පවතින තාක්ෂණික ධාරිතා හා විශේෂඥ දැනුමෙන් සිදු කළ නොහැකි විවිධ ක්ෂේත්‍ර සඳහා තම දායකත්වය ලබා දීමට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සමත් ව ඇත.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ඊට පවරා ඇති කාර්යයන්, එහි ඒකාබද්ධ සැලැස්ම සහ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව පහත සඳහන් විශේෂිත වූ කාර්යභාරයන් ද සමාලෝචිත වර්ෂය තුළ, ක්‍රියාත්මක කරන ලදී.

රාජ්‍ය ප්‍රතිපාදන යටතේ කරන ලද ව්‍යාපෘති

නායයාම් අපදා කලාප සිතියම්ගත කිරීමේ ව්‍යාපෘතිය (LHMP)

1985 වසරේ සිදුවූ දරුණු නායයෑම්වලින් පසු රජය විසින් නායයෑම් අධ්‍යයනය ජා. ගො. ප. සංවිධානය වෙත පවරා ඇත. ඉන් අනතුරු ව ජා. ගො. ප. සංවිධානය විසින් නායයෑම් හඳුනාගැනීම හා සිතියම් ගත කිරීමේ කටයුතු සඳහා නායයෑම් අවදානම් කළාප සිතියම් ගත කිරීමේ ව්‍යාපෘතිය (LHMP) 1992 වසරේ දී එක්සත් ජාතීන්ගේ සමාරම්භක වැඩසටහන (UNDP) සහාය ද ඇති ව දියත්කරන ලදී. පසු ව එම ව්‍යාපෘතිය මඟින් මේ දක්වා රාජ්‍ය අරමුදල් යටතේ නායයෑම් අවදානම් සහිත ප්‍රදේශ සිතියම්ගත කිරීම සිදුකෙරේ. හඳුනාගත් දිස්ත්‍රික්ක 13 ක සමස්ත වර්ග කි. මීටර් 32,593.1 ක ප්‍රදේශයක් ආවරණය වන පරිදි 1:50,000 පරිමාණයට අනුව සිතියම් ගතකර ඇති අතර ඊට අමතර ව ප්‍රමුඛතා කළාප ඇතුලත්වන පරිදි වර්ග කි. මීටර් 7,560 ක භූමි ප්‍රමාණයක් ආවරණය කරමින් 1:10,000 පරිමාණය යටතේ සිතියම්ගත කර ඇත.

2019 වසර තුල ව්‍යාපෘතිය සඳහා රජය මඟින් රු. මිලියන 20.0 ක ප්‍රතිපාදන ලැබී ඇති අතර එහි ප්‍රතිඵල ලෙස මාතලේ හා නුවරඑළිය දිස්ත්‍රික්ක තුල වර්ග කි. මීටර් 40.0 බැගින් ආවරණයවන පරිදි 1:10,000 පරිමාණයේ සිතියම් පත් 9 ක් නිර්මාණය කර ඇත. 1:10,000 පරිමාණය යටතේ ආවරණයවන සමස්ත භූමි ප්‍රමාණය වර්ග කි. මීටර් 360.0 කි.

මෙම ව්‍යාපෘතිය මඟින් සකස් කරන ලද සිතියම්, නායයෑම් පූර්ව අනතුරු හැඟවීම් නිකුත් කිරීමට ද, ආපදා තක්සේරු කිරීම උදෙසා නායයෑම් විමර්ශන කටයුතු සඳහා ද නායයෑම් අවදානම් තක්සේරු කිරීමේ වාර්තා නිකුත් කිරීම සඳහා ද, නාය අනතුරු සිදුවිය හැකි භූමි හඳුනාගැනීමේ ප්‍රමුඛතාවය අනුව අවම කිරීමේ ව්‍යුහය ම ය ක්‍රමවේද යෙදීමේ කාර්යයන් සඳහා ද භාවිතා කරනු ලැබේ. තව ද, ඒවා විවිධ ආයතන මඟින් ජාතික සහ ප්‍රාදේශීය මට්ටමේ සැළසුම්කරණ කටයුතු සඳහා ද මෙම සිතියම් භාවිතා කරනු ලැබේ. මෙම සිතියම්වලින් බොහොමයක් ජා. ගො. ප. සංවිධානයේ වෙබ් අඩවියෙන් නොමිලේ බාගත කරගැනීමට හැකියාව තිබේ (www.nbro.gov.lk).







උපද්‍රව කළාපකරණ සිතියම 1: 50,000 පරිමාණය

නායයාම් අවදානම තක්සේරුකර වාර්තා කිරීමේ ක්‍රියාවලිය (LRAR)

ජා. ගො. ප. සංවිධානය නායයෑම් අවදානම් තක්සේරු වාර්තාවක් නිකුත් කරනු ලබන අතර එමගින් නායයෑම් සිදුවිය හැකි ප්‍රදේශවල ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු සඳහා අවසර ලබා දෙන්නේ ද නැද්ද යන්න පිළිබඳ ව නිර්දේශ ලබා දේ. නායයෑම් අවදානම් තක්සේරු වාර්තා ලබාදීම 2011 වර්ෂයේ මුලින් ම ආරම්භ වූ අතර 2019 දෙසැ. 31 වන විට ඉල්ලුම්පත් 81,275 ක් ලැබී ඇත. 2019 වසර තුල ලැබුණු ඉල්ලුම්පත් සංඛ්‍යාව 7,971 වන අතර 7,601 ක අනුමැති නිකුක්කර ඇති අතර ප්‍රතික්ෂේපිත අයදුම්පත් 115 කි. ජා.ගො. ප. සංවිධානය විසින් අවශ්‍ය විමර්ශනයන් සිදුකිරීම හා වාර්තා නිකුත් කිරීම සඳහා නාමික ගාස්තුවක් අයකරනු කරනු ලැබේ. 2019 වසරේ දී මෙම ක්‍රියාවලියේ පුනරාවර්තන වියදම් ආවරණය කරනු පිණිස මහා භාණ්ඩාගාරයෙන් රු. මිලියන 28.0 ක ප්‍රතිපාදන සපයනු ලැබූ අතර ඉතිරි මුදල ආයතනික සමාජ වගකීම යටතේ ආයතනයේ ආදායමින් දරා ඇත.

වගුව: 2011 වර්ෂයේ මාර්තු මස ආරම්භයේ සිට මේ දක්වා LRAR විස්තර

	(district) දිස්ත්‍රික්කය	1	2			3=1-(2a+2b+2c)	Pending Application Details (අතිරික්ත ඉල්ලුම්පත් පිළිබද විස්තර)		
		Total Applications Received (ලැබු ඉල්ලුම්පත් සංඛ්‍යාව)	Total Applications work completed (වැඩ නිමකළ ඉල්ලුම්පත් සංඛ්‍යාව)			Total applications pending (අතිරික්ත ඉල්ලුම්පත් සංඛ්‍යාව)	Pending For initial Investigation (මූලික පරීක්ෂණ සඳහා)	Referred to revisit/detailed investigation විස්තරාත්මක අධ්‍යයනයට යොමු කිරිම සඳහා)	Documents Pending from Client (ඉල්ලුම්කරුගෙන් අදාල ලියකියවිලි ලැබෙන තෙක්)
			2a Permission granted (අනුමැතිය ලබා දුන් ඉල්ලුම්පත්)	2b Permission not granted (අනුමැතිය ලබා නොදුන් ඉල්ලුම්පත්)	2c Applications rejected due to other reasions (වෙනත් හේතුන් මත අවසරය ලබා නොදුන් ඉල්ලුම්පත්)				
1	Kandy	18656	16750	290	1392	224	27	5	192
2	Matale	7825	7716	16	33	60	46	0	14
3	Nuwaraeliya	6957	6706	48	51	152	38	79	35
4	Badulla	10576	10004	166	310	96	59	28	9
5	Kagalle	10562	10102	40	420	0	0	0	0
6	Rathnapura	9943	8497	36	1336	74	52	2	20
7	Kaluthara	939	905	5	26	3	3	0	0
8	Galle	13666	13615	8	23	20	18	2	0
9	Matara	2082	2070	5	7	0	0	0	0
10	Hambanthota	36	36	0	0	0	0	0	0
11	Kurunagala	20	20	0	0	0	0	0	0
Total		**81262**	**76421**	**614**	**3598**	**629**	**243**	**116**	**270**

නායයෑම් විශේෂ විමර්ශන (SPI)

නායයෑම් නිසා අසල්වැසි ජනාවාස, යටිතල පහසුකම් සහ වතු ආශ්‍රිතව පවතින අවදානම හඳුනාගැනීම සහ ජීවිත, දේපලවල ආරක්ෂාව තහවුරුකිරීම සඳහා නායයෑම් සම්බන්ධ විශේෂ විමර්ශන පවත්වා කඩිනම් නිර්දේශ ලබාදෙන මෙන් දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම්වරු මෙන්ම වෙනත් රජයේ ආයතනවල නිලධාරීන් විසින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය වෙත ඉල්ලීම් කෙරේ. 2019 වර්ෂයේදී එවැනි නායයෑම් විශේෂ විමර්ශන 3,355 ක් සිදුකර ඇත. ඒ සඳහා මහා භාණ්ඩාගාරය විසින් රු. මිලියන 55.0 ක ප්‍රතිපාදන සපයන ලදී.

නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘති (රාජ්‍ය අරමුදල්)

නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය හා විශේෂ විමර්ශනවලින් අවම කිරීම අවශ්‍ය යැයි හඳුනාගෙන ඇති පහත සඳහන් ප්‍රමුඛතා ස්ථාන අටක් නායයෑම් සහ බෑවුම් අස්ථායීතාවයන් 2019 වසරේදී අවමකරනු ලැබ තිබේ.

අනු අංකය	දිස්ත්‍රික්කය	ව්‍යාපෘතිය/ස්ථානය	පිරිවැය (රු. මි.)
01	මහනුවර	ගඩලාදෙණිය මධ්‍ය විද්‍යාලයය - උඩුනුවර	20.9
02	මහනුවර	මහවත්ත මහා විද්‍යාලයය - කුණ්ඩසාලේ	29.7
03	මාතලේ	සිරි ධර්මතිලක විද්‍යාලයය - උකුවෙල	26.8
04	බදුල්ල	කහටවෙල රුහුණු විද්‍යාලයය - හපුතලේ	29.7
05	මහනුවර	ජල පවිත්‍රාගාරය - ගම්පොල, උඩපළාත	38.6
06	මහනුවර	හිල්වුඩ් විද්‍යාලයය, මහනුවර -ගඟවෙල කෝරලේ	9.2
07	බදුල්ල	උඩුහාවර ශ්‍රී විජයාරාමය සහ වෙලමඩගම වෙත පිවිසීමේ මාර්ගය - ඌව පරණගම	4.3
08	බදුල්ල	කෝවිල් කඩේ මාර්ගයේ අස්ථාවර කැපීම - පස්සර	0.6

නායයෑමේ අවදානමක් ඇති ප්‍රදේශ සඳහා ආපදා පැතිකඩ සෑදීම

1 : 10,000 ප්‍රමාණයේ නායයෑම් අවදානම් සිතියම්

නායයෑමක් සිදුවුවහොත් අපේක්ෂිත ජීවිත හා දේපල හානි ඇතිවීමේ විභවයන් පිළිබඳ ව නායයෑම් අවදානම් සිතියම් මගින් පෙන්නුම් කෙරේ. නායයෑම් ආපදා කලාප සිතියම් හා මානව ජනාවාස සිතියම් ඒකාබද්ධ කිරීම මඟින් නායයෑම් අවදානම් සිතියම් සංවර්ධනය කර ඇත. මෙම සිතියම් නායයෑම්වලට ලක්විය විය හැකි ඉඩම් සංවර්ධනය හා භාවිතය සහ ආයෝජන සඳහා මග පෙන්වන මෙවලමක් ලෙස භාවිතා කිරීමට හැකිවනු ඇත.

- 2018 - නිරාවරණ සිතියම් 123 සකස් කර ඇත.
- 2019 - නිරාවරණ සිතියම් 04 සකස් කර ඇත.

අවදානම් සහිත මූලයන් පිළිබඳ දත්ත පද්ධතිය

කඩිනම් හා කාර්යක්ෂම ව දත්තයන් ලබාගත හැකිවන පරිදි සකසන ලද සංවිධානාත්මක වාර්තා විද්‍යුත් ගොනුගත කිරීමක් දත්ත පද්ධපතියක් ලෙස හැඳින්විය හැක. යම් ප්‍රදේශයක් තුල ජනගහනය, දේපල, ආර්ථික ක්‍රියාකාරකම් හෝ ප්‍රදේශයේ ආපදාවලට නිරාවරණය වන වෙනත් අර්ථදක්වා ඇති ආර්ථික වටිනාකම් සහිත මූලයන් පිළිබඳ දත්ත සමුදායක් සහිත තොරතුරු පද්ධතියක් ජා. ගො. ප. සංවිධානය විසින් නිර්මාණය කර ඇත. මූලික අවදානම් විශ්ලේෂණයේ අරමුණ වන්නේ නායයෑම් අවදානමක් සහිත ජනාවාසවල සහ ගොඩනැගිලිවල ලක්ෂණ තක්සේරු කිරීම යි.

- 2019 - ගොඩනැගිලි ඒකක 10517 ක් තොරතුරු පද්ධතියට අතුලත්කර ඇත.

ඉඩම් බැංකු සිතියම්ගත කිරීම

නායයෑම් උපද්‍රව සිතියම්, නායයෑම් අවදානම් සිතියම් භාවිතය හා උපයෝගිතාවයෙන් සංවර්ධන ක්‍රියාවලියේ තීරණ ගැනීමේ දී ඇතිවන පරතරය පිරවීම පිණිස “ඉඩම් බැංකු” සංකල්පය ආරම්භකර ඇත. නායයෑමට ලක්විය හැකි ප්‍රදේශවල සංවර්ධන ක්‍රියාවලින් සැළසුම් කිරීමේ දී හා තීරණ ගැනීමේ දී භාවිතා කල හැකි සුදුසු ඉඩම් හඳුනාගැනීමේ හා ඒ හා සම්බන්ධ පහසුකම් සැපයෙන මෙවලමක් ලෙස ඉඩම් බැංකු සිතියම් භාවිතයට ගැනේ.

ඉඩම් බැංකුව යනු සංවර්ධනය සඳහා භාවිතා කල හැකි ආරක්ෂිත ඉඩම් සංචිතයකි. මෙය සංවර්ධන නියෝජිතායතන, ග්‍රාමීය සංවර්ධන කටයුතු, නැවත පදිංචිකිරීමේ ක්‍රියාකාරකම් සහ නායයෑම් අවම කිරීමේ ක්‍රියාමාර්ග හා අනෙකුත් ප්‍රධාන සංවර්ධන භූමි භාවිතයන් සඳහා පරිශීලනය කලහැක.

- 2018 – 1 : 10,000 පරිමාණයේ ඉඩම් බැංකු සිතියම් 31 ක් සම්පූර්ණ කර ඇත.

නායයෑම් උපද්‍රව සිතියමක් (76/03)



නායයෑම් අවදානම් සිතියමක් (76/03)

ස්වයංක්‍රීය වර්ෂාමාන ජාලය පුළුල් කිරීම තුලින් තත් කාලීනව නායයාම් පුරෝකථනය සහ පූර්ව අනතුරු ඇඟවීමේ ශක්‍යතාවය වැඩිදියුණු කිරීම

කාර්යක්ෂ ම නායයෑම් අනතුරු හැඟවීම් ක්‍රියාවලීන් සඳහා ස්වයංක්‍රීය නියාමනය සහිත වර්ෂාමාන ජාලයක් ස්ථාපනය කර ඇත. අධික තීව්‍රතාවයකින් යුතු වර්ෂා නිසා පාංශු තෙතමනය අධික ලෙස ඉහළයාමෙන් බොහෝ විට නායයෑම් ආරම්භ වේ. කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන කාළගුණ අනාවැකි හා ජා. ගො. ප. සංවිධානය විසින් ස්ථාපනය කර ඇති ස්වයංක්‍රීය වර්ෂාමාන ජාලයෙන් ලබාගන්නා දත්තයන් අනුසාරයෙන් ජා. ගො. ප. සංවිධානය විසින් නායයෑමේ පූර්ව අනතුරු හැඟවීම් නිවේදන නිකුත් කරයි.

මේවන විට ස්වයංක්‍රීය වර්ෂාමාන 275 කින් සමන්විත පද්ධතියක් ස්ථාපනය කොට ක්‍රියාත්මක වන අතර, පද්ධතිය මඟින් ලබාගන්නා යාවත්කාලීන දත්ත භාවිතයෙන් නායයෑම් පූර්ව අනතුරු හැඟවීමේ ක්‍රියාවලිය සිදුකරයි. අයහපත් කාළගුණ තත්ත්වයන් හි දී 24 පැය පුරා ක්‍රියාත්මක නායයෑම් අනතුරු හැඟවීමේ මධ්‍යස්ථානය: ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ජාතික මෙහෙයුම් මධ්‍යස්ථානය හරහා නායයෑමට ලක්විය හැකි ප්‍රජාව වෙත පූර්ව අනතුරු හැඟවීමේ නිවේදන නිකුත් කිරීම සිදු කෙරේ.





ස්වයංක්‍රීය හා සරල වැසි මිනුම් මාපක පවතින ස්ථාන

නායයෑම් පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය වැඩිදියුණු කිරීම - ක්ෂේත්‍ර සඳහා නිශ්චිත අනතුරු ඇඟවීම

- නායයෑම් දුරස්ථ අධීක්ෂණ පද්ධතිය (LRMS) සංවර්ධනය - ගුවන්විදුලි සන්නිවේදන ජාලයක් භාවිතයෙන් ස්ථානීය අධීක්ෂණ දත්ත සම්ප්‍රේෂණය කිරීමට මෙය සමත් වේ.
- විස්තාරක, වර්ෂාපතන මිනුම් සහ වෙනත් උපාංගවල අධීක්ෂණ දත්ත කිහිපයක් මත පදනම් ව නායයෑම්
- ශ්‍රී ලංකාවේ නායයෑම් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම සඳහා පාලන දර්ශකයක් තීරණය කිරීම



නායයෑම් දුරස්ථ අධීක්ෂණ පද්ධතිය

ශ්‍රී ලංකාවේ රසායනික ආපදා අවදානම් විධිමත් ව තක්සේරු කිරීම

රසායන ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්තවල සිදුවන අනතුරු ඉහලයාමේ ප්‍රවනතාවයක් දක්නට ලැබෙන අතර ආශ්‍රිත ප්‍රදේශවල අවදානමට ලක්විය හැකි ඒකකයන් මෙම උපද්‍රවයන්ට නිරාවරණය වීම තුලින් මානව ක්‍රියාකාරකම් මත ජනිතවන ව්‍යසනයන්ට පාදක විය හැක. අවදානම තක්සේරු කිරීම සඳහා ක්‍රමානුකූල ක්‍රියා පටිපාටියක් නොමැති වීමත් සමස්ථ තත්ත්වය පිළිබඳ ව මහජනතාව වෙත විනිවිද භාවයකින් යුතු ව තොරතුරු ගලා නොයාමත් මත තත්ත්වය වඩාත් අයහපත් වේ. අතීත සිදුවීම් තුලින් පවත්නා ආපදා කළමනාකරණ ක්‍රියාදාමයේ පවත්නා හිඩැස හඳුනාගෙන ඇති අතර රසායනික විපත් සඳහා පවතින විභවයන් අවබෝධ කරගනිමින් රසායනික අනතුරු අවම කරගැනීමේ සැකැස්මක් හා රසායනික අනතුරු ආශ්‍රිත ආපදා කළමනාකරණ පිළිබඳ සුදුසු නෛතික පද්ධතියක් හඳුන්වාදීමේ දැඩි අවශ්‍යතාවයක් පවතී.

මේ සඳහා වන පර්යේෂණ අධ්‍යයනය සඳහා සූදානම් කිරීමේ කටයුතු මේවන විටත් සම්පූර්ණ කර ඇත. කර්මාන්ත සඳහා භාවිතා කෙරෙන රසායන ද්‍රව්‍යයන් සඳහා වන අවදානම් තක්සේරු කිරීමේ ක්‍රමවේදය මේවන විට සකස් කරමින් පවතී. අවදානම් සහ බලපෑම් තක්සේරු කිරීම් සඳහා තාක්ෂණික දත්ත භාවිතා කරමින් රසායනික ද්‍රව්‍ය රැස් කිරීම සඳහා “තොරතුරු පද්ධති වේදිකාවක්” සංවර්ධනය වෙමින් පවතී. තාක්ෂණික රසායනික ද්‍රව්‍ය පහක් සඳහාවන ආරක්ෂක මාර්ගෝපදේශන පොතෙහි පළමු වෙළුම සකස් කර අදාල පුද්ගලයින්ගේ භාවිතය සඳහා ප්‍රකාශයට පත්කොට ඇත. තව ද රසායනික ආපදා කළමනාකරණය සඳහා අදාල බලධාරීන් හඳුනාගැනීම සඳහා පරීක්ෂකවරුන්ගේ වැඩමුළුවක් සාර්ථක ව පවත්වා ඇත. ඒ හා සමගාමී ව ජා. ගො. ප. සංවිධානයේ විද්‍යාඥයින්ගේ හා රසායනික ආපදා කළමනාකරණයට අදාල පාර්ශවකාර සංවිධානවල නිපුණතා සංවර්ධනය සඳහා ධාරිතා වර්ධන වැඩමුළු හයක්, ව්‍යාපෘති උපදේශක, මොරටුව විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ට කතිකාචාර්ය ඉංජිනේරු තිස්ස ඒ. දොඩංගොඩ මහතාගේ සම්පත් දායකත්වයෙන් පවත්වන ලදී.

ගොඩනැගිලි තක්සේරු කිරීම සහ තත්ත්ව වාර්තාකරණය සඳහා ක්‍රමෝපායක් සංවර්ධනය කිරීම

රජය සතු පොදු ගොඩනැගිලි සඳහා සහ මහජනතාව බහුලව භාවිතා කරන අනෙකුත් ගොඩනැගිලි හිමිකරුවන්ට ගොඩනැගිලිවල තත්ත්වය පිළිබඳ පහත සඳහන් එකක් හෝ කීපයක් කරුණු වෙනුවෙන් ජා. ගො. ප. සංවිධානය වෙතින් විමර්ශනය සිදුකොට තාක්ෂණික ඇගැයීම් වාර්තාවක් ලබාගැනීමත්, ඒ මඟින් සිදුකෙරෙන තාක්ෂණික නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමටත් හැකියාව පවතී. ජා. ගො. ප. සංවිධානය මඟින් 2019 වසර තුල ව්‍යුහාත්මක ඇගැයීම් හා විමර්ශන 61 ක් සිදුකර ඇත.

- නිර්මිත කාලයට වඩා පැරණි වීම
- ඉපැරණි බව නිසා පරිහානියට පත්බව විද්‍යාමාන වීම
- දුර්වල ව්‍යුහාත්මක අඛණ්ඩතාව
- ව්‍යසනයක දී ශාරීරික හානි සිදුවිය හැකිවීම
- දුර්වල නඩත්තුකරණය
- අවට පරිසරයේ ඉදිකිරීම්වල බලපෑම

ආපදා ඇති ප්‍රදේශවල වෙසෙන ජනතාව සඳහා පෙරසවි කොන්ක්‍රීට්වලින් නිර්මිත ආපදාවලට ඔරොත්තු දෙන නිවාස ඉදිකිරීම

පසුගිය දශකය තුල ශ්‍රී ලංකාවේ නායයෑම්, ගංවතුර සහ අධික සුළං වැනි ස්වභාවික විපත් සිදුවීමේ වැඩි ප්‍රවනතාවයක් ඇතිවිය. ස්වභාවික හේතුන් හා මානව ක්‍රියාකාරකම් නිසා අතිවිශාල මිනිස් ජීවිත හානිවීම්, ජීවනෝපාය අහිමිවීම් හා ආර්ථික කටයුතු සඳහා බාධා පැමිණීම සිදුවිය. සෑම ආපදා සිදුවීමකින් පසුවම සහන වියදම් විශාල ලෙස වැඩි විය. ඒ අනුව රජය විසින් ආපදාවන්ට ලක්විය හැකි ප්‍රදේශවල වෙසෙන ජනතාව ආරක්ෂිත ස්ථානවල නැවත පදිංචි කිරීමට තීරණය කර ඇත. නායයෑම් සඳහා පමණක් ලක්විය හැකි එවැනි පවුල් 14,000 ක් ජා. ගො. ප. සංවිධානය විසින් හඳුනාගෙන ඇත. 2016 වසරේ සිට රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය මෙම පවුල් නැවත පදිංචි කරවීම හිමිකරු නියාමක ප්‍රවේශයක් තුලින් ක්‍රියාත්මක කරයි. මෙම ප්‍රවේශයෙ හි පවතින මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් “ආපදා ප්‍රතිරෝධී පෙරසවි නිවාස” ඉදිකිරීම තුලින් නැවත පදිංචිකිරීමේ වැඩසටහන වේගවත් කිරීමට රජය තීරණය කළේ ය. ඒ අනුව ආපදා සහිත ප්‍රදේශවල වෙසෙන ජනතාව වෙනුවෙන් “ආපදා ප්‍රතිරෝධී පෙරසවි නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය” 2019 සැප්තැම්බර් මාසයේ අරඹන ලදී. ව්‍යාපෘතියේ ප්‍රථම අදියර යටතේ පෙරසවි නිවාස ඒකක 400 ක් කළුතර හා රත්නපුර දිස්ත්‍රික්ක ආශ්‍රිත ව ඉදිකෙරෙන අතර පිඹුරවත්ත, මිරිස්හේන සහ හල්වතුර යන වැඩබිම් මේවන විටත් ආරම්භ කර ඇත.

මීතොටමුල්ල කසල රැඳවුම සංවර්ධන කටයුතු සඳහා

පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන්



2019 වසරේ දී රු. මිලියන 15.0 ක ප්‍රතිපාදන පර්යේෂණ සඳහා හිමි විය. පාර්ශවකරුවන්ගේ, ආයතනවල සහ ඉදිකිරීම් කර්මාන්තයේ පර්යේෂණ අවශ්‍යතා අධ්‍යයනය සඳහා තාක්‍ෂණික උපදේශන වැඩමුළුවක් 2019 ජනවාරි 29 දින පවත්වන ලදී. ආපදා තත්ත්වයකට ඔරොත්තුදීමේ හැකියාව නිර්මාණය කිරීම කෙරෙහි අවධානය යොමු කෙරුනු පර්යේෂණ ව්‍යාපෘති සහිත වැඩසටහන් ක්‍රියාවට නැංවිනි. පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රතිඵල 2019 දෙසැම්බර් මස 17 හා 18 දිනයන් හි දී කොළඹ දී ‘Equitable Resilience’ තේමාව යටතේ පවත්වන ලද ජා. ගො. ප. සංවිධානයේ 10 වන වාර්ෂික පර්යේෂණ සමුළුවේදී ඉදිරිපත් කරන ලදි. සමුළුවේ කටයුතු අතරතුර තාක්‍ෂණික පත්‍රිකා 48 ක් ද ප්‍රකාශයට පත් කිරීම සිදුවිය. සමුළුවට සහභාගීවූවන් සඳහා අත්දැකීම් හුවමාරු කරගැනීමේ හා සාකච්ඡා කරගැනීමේ වේදිකාවක් නිර්මාණය විය.

2019 වර්ෂයේ පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති

ආපදා ප්‍රත්‍යස්ථක සහිත ඉදිකිරීම් පිළිබඳ අත්පොත් අඛණ්ඩ ව වර්ධන කිරීම

කර්මාන්ත උපදේශනයේ ඉල්ලීම පරිදි පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් යටතේ අත්පොත් කීපයක් සම්පාදනය සඳහා ජා. ගො. ප. සංවිධානය විසින් පර්යේෂණ ව්‍යාපෘති කීපයක් සකස් කරන ලදී. අදාල ක්ෂේත්‍රයන් හි ප්‍රවීනයන්ගේ සහාය මේ සඳහා ලැබුණු අතර මෙහෙයුම් කමිටුව විසින් අවශ්‍ය මාර්ගෝපදේශනයන් සපයන ලදී. ප්‍රථමයෙන් ම කෙටුම්පත් පාර්ශවකාර ආයතනවල හා ඉදිකිරීම් කර්මාන්තයේ නියෝජිතයන් වෙත ඉදිරිපත් කරන ලද අතර පසුව ඔවුන්ගේ ද උපදෙස් පරිදි නැවත සංශෝධනය කරන ලදී. අවසන් ලේඛනය 2019 දෙසැ. මස පැවැති සමුළුවට සමගාමී ව ප්‍රකාශයට පත්කරන ලද අතර ජා. ගො. ප. සංවිධානයේ නිල වෙබ් අඩවිය ඔස්සේ නොමිලේ බාගත කරගැනීමේ පහසුකම් සලසා ඇත. www.nbro.gov.lk

ඉදිකිරීම් කර්මාන්තය සඳහා අවශ්‍යවන නිෂ්පාදන හා අමුද්‍රව්‍ය තෝරා ගැනීම සඳහා වූ මාර්ගෝපදේශන මාලා සකස් කිරීම



ශ්‍රී ලංකාව තුල ඉදිකිරීම් කර්මාන්ත වෘත්තිකයන් සඳහා රටතුල වඩාත් යෝග්‍ය හා සුවිශේෂී ඉදිකිරීම් අමුද්‍රව්‍ය හා නිෂ්පාදන භාවිතය තහවුරුවන අයුරින්, ඉදිකිරීම් අමුද්‍රව්‍ය හා නිෂ්පාදන තෝරාගැනීම සඳහාවන මාර්ගෝපදේශ නොමැති අඩුව හඳුනාගත් ජා. ගො. ප. සංවිධානය ඒ වෙනුවෙන් සක්‍රිය කාර්යයභාරයක් ඉටුකරමින් පර්යේෂණ ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාවට නැංවිය. මෙම ව්‍යාපෘතියේ ප්‍රතිඵලයක් ලෙස ‘‘ගොඩනැගිලි ද්‍රව්‍යයන් හා නිෂ්පාදන තෝරාගැනීම සඳහාවන පිරිවිතරයන් හා පර්යේෂණ ක්‍රම’’ පිළිබඳ අත්පොතෙහි ප්‍රථම වෙලුම ‘‘පොදු ඉදිකිරීම් අමුද්‍රව්‍ය හා නිෂ්පාදන’’ ප්‍රකාශනය එළිදක්වා ඇත. මෙම ප්‍රකාශනය තුලින් රටතුල බහුලව භාවිතාවන බොහෝ ගොඩනැගිලි ද්‍රව්‍යවල ගුණාංග, පරීක්‍ෂණ ක්‍රමවේදයන් හා ප්‍රමිතීන් තරමක් සවිස්තරාත්මක ව දක්වා ඇත. ආපදාවන්ට ලක්වූ සහ ආපදාවන්ට ලක්විය හැකි ප්‍රජාවන් නැවත පදිංචිකිරීම සඳහාවන ව්‍යාපෘති වැනි විශාල නිවාස ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා මෙම ලේඛනය වඩාත් ඵලදායීවනු ඇත. ඉදිරි දෙවසරක කාලය තුල ක්‍රියාත්මක වීමට නියමිත මෙම ව්‍යාපෘතිය මඟින් දෙවන සහ තුන්වන වෙලුම් සම්පාදනය කිරීමට නියමිත ව ඇත.

උස් ගොඩනැගිලි සඳහා භූ තාක්‍ෂණ මාර්ගෝපදේශන සකස්කිරීම



උස් ගොඩනැගිලි සහ ගොඩනැගිලි සංකීර්ණ සඳහාවන තැනීම් හා අනෙකුත් ඉදිකිරීම් ක්‍රියාකාරකම් බොහෝවිට යාබද ගොඩනැගිලිවල ස්ථායීතාවයට බලපාන අතර ඇතැම් අවස්ථාවල හානි ඇතිකරයි. මේ සඳහා මෙය වැලැක්වීමේ පියවරක් ලෙස ඉදිකිරීම් කාර්යය මණ්ඩලයන් වෙත නිසි හා ක්‍රමානුකූල වැඩ ක්‍රමවේදයන් අනුගමනය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ යාන්ත්‍රණයක් සැකසීම අවශ්‍ය වේ. මෙම පර්යේෂණ ව්‍යාපෘතිය වර්තමාන සැළසුම් හා ඉදිකිරීම් කටයුතුවල වාසි සහ අවාසි පිළිබඳ විමසීමක් සිදුකල අතර අනුගමනය කළ යුතු නිවැරදි ක්‍රමවේදයන් නිර්දේශ කළ අතර ව්‍යාපෘතියෙහි ප්‍රතිඵලයක් ලෙස ‘‘ගොඩනැගිලි පදනම් සුරක්ෂිතව ඉදිකිරීම පිළිබඳ ව භූතාක්‍ෂණ මාර්ගෝපදේශය’’ සම්පාදනය කොට ප්‍රකාශයට පත් කෙරිණි.

ශ්‍රී ලංකාව තුල ගොඩනැගිලි කඩා බිඳ දැමීමේ කටයුතු සඳහාවන මාර්ගෝපදේශ සැකසීම



ව්‍යවස්ථාපිත තාක්ෂණික මාර්ගෝපදේශනයන් කේත, ආරක්ෂණ ප්‍රමිතීන් හෝ රෙගුලාසි නොමැතිවීම හේතුවෙන් ශ්‍රී ලංකාව තුල ගොඩනැගිලි කඩා බිඳ දැමීමේ කටයුතු නිසි ක්‍රියාපටිපාටීන් අනුගමනය නොකර බොහෝ විට සිදුකෙරේ. ජීවිත හා දේපලවල ආරක්ෂාව සහතික කිරීම සඳහා සැළසුම් කිරීම, මෙහෙයවීම, අධීක්ෂණය සහ ඒ සඳහා අදාල වෘත්තිකයන්ගේ මැදිහත්වීම නොමැතිකම මැතක දී සිදුවූ ඛේදජනක සිදුවීම් සඳහා පාදනම් වී ඇත. ඒ අනුව පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස ජා. ගො. ප. සංවිධානය විසින් ගොඩනැගිලි කඩා බිඳ දැමීමේ හා කොන්ත්‍රාත්කරුවන්ගේ අත්දැකීම් පිළිබඳ ගෝලීය හා දේශීය භාවිතයන් පිළිබඳ ව අවශ්‍ය අධ්‍යයනයන් සිදුකළ අතර කඩා බිඳ දැමීමේ කටයුතු සඳහා ආරක්ෂිත හා යහපත් භාවිතයන් පිළිබඳ මඟපෙන්වීම සඳහා “ශ්‍රී ලංකාවේ ගොඩනැගිලි කඩා බිඳ දැමීමේ කටයුතු පිළිබඳ තාක්ෂණික මාර්ගෝපදේශය’’ සම්පාදනය කර ඇත. මෙම මාර්ගෝපදේශය තුලින් ශ්‍රී ලංකාව තුල නාගරික තදාසන්න ප්‍රදේශවල පිහිටි පෙදරේරු සහ කොන්ක්‍රීට් වැර ගැන්වූම් සහිත නොඋස් ගොඩනැගිලි කඩා බිඳ දැමීම පිළිබඳ ව විස්තාරණය කර ඇත.

කොළඹ නගරය තුල ආපදා ප්‍රත්‍යස්ථික නිවාස සඳහා භූ විද්‍යාත්මක හා භූ තාක්ෂණික ත්‍රිමාණ උප පෘෂ්ඨීය ආකෘතිය



කොළඹ නගරය තුල ඕනෑම මොහොතක ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතී. එමෙන් ම බොහෝ ව්‍යාපෘති සැළසුම් අවධියේ පවතී. කිසියම් භූ තාක්ෂණික පරීක්ෂණයක් සහ අත්තිවාරම් සැළසුම් කිරීමක් ආරම්භ කිරීමට පෙර ඉදිකිරීම් භූමියෙහි මතුපිට පෘෂ්ඨීය ස්වභාවය පිළිබඳ අවබෝධ කරගැනීම සැමවිටම වාසිදායක වේ. අතීතයේ සිදුකරන ලද පරීක්ෂණ ආශ්‍රිත විශාල දත්ත සමුදායක් ජා. ගො. ප. සංවිධානය සතු ව පවතී. මෙම දත්ත රැස්කිරීම හා කොළඹ මහනගර සභා ප්‍රදේශය තුල ත්‍රිමාණ උප පෘෂ්ඨීය භූ විද්‍යාත්මක, භූ තාක්ෂණික දත්ත ලබාගත හැකි පරිඝනක ආශ්‍රිත ආකෘති සැකසීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදුකරන ලදී. මෙම ආකෘතීන් මේවන විට ජා. ගො. ප. සංවිධානයේ වෙබ් අඩවිය තුලින් ගවේෂණය සඳහා පහසුකම් සලසා ඇති අතර එය භූ තාක්ෂණික වෘත්තිකයන් සහ ඉදිකිරීම් වෘත්තිකයන් හට ඵලදායීවනු ඇත. මෙම ආකෘතීන් තවදුරටත් වැඩි දියුණු කිරීම් සඳහාවන දත්තයන් ඉදිරියේ දී එක් කිරීමට නියමිත ව ඇත.

ශ්‍රී ලංකාව සඳහා ගොඩනැගිලි කේත සැකසීම

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (ඉ. ක. සං. අ) විසින් සිදුකරනු ලබන ශ්‍රී ලංකාවට උචිත දේශීය වශයෙන් යෝග්‍ය ගොඩනැගිලි කේතනයන් සැකසීම සඳහා ජා. ගො. ප. සංවිධානයේ දායකත්වය ලබා දී ඇත. ජාත්‍යන්තර කේත සවුන්සලයේ නිර්දේශ මත ශ්‍රී ලංකා කේත සංවර්ධන ක්‍රියාවලියෙ හි දී ජාත්‍යන්තර ගොඩනැගිලි නීති සංග්‍රහය පාදක කරගැනීමට ඉ. ක. සං. අ. කටයුතු කර ඇත. මෙම සන්ධර්බය තුල ජා. ගො. ප. සංවිධානය විසින් “ආපදා තත්වයන්ට ඔරොත්තු දීමේ ගොඩනැගිලි කේතය” සංවර්ධනය කිරීමේ කටයුතු සිදුකරන අතර ඉදිරි මාස 9-12 කාල සීමාව තුල මෙම කටයුතු සම්පූර්ණ කිරීමට අපේක්ෂිත ය.

ආපදාවන්ට ලක්වූ ප්‍රජාවන් සඳහාවන සංක්‍රාන්ති නිවාස සැළසුම්කරණය

දේශගුණික විපර්යාශයන් සහ සැළසුම් රහිත මානව ජනාවාසකරණය හේතුකොට ගෙන මෑත භාගයේ ආපදා සිදුවීමේ ප්‍රවනතාවය ඉහල ගොස් ඇත. අධි අනතුරුදායී කළාපවල වෙසෙන ජනතාව වෙත ආපදා අවදානම් අවස්ථාවල දී නිවාස ඉවත් කරගන්නා ලෙස නියෝග කරන අතර එවන් අවස්ථාවල ඔවුන් හට ස්ථිර නිවාස විසඳුම් ලැබෙන තෙක් තාවකාලික නිවාසවල වාසය කිරීමට සිදුවනු ඇත. වර්තමානයේ භාවිතාවන තාවකාලික වාසස්ථාන වන්නේ පාසල් ගොඩනැගිලි, කූඩාරම් හෝ වෙනත් පොදු ගොඩනැගිලි වේ. මෙම පර්යේෂණ ව්‍යාපෘතිය මගින් පවුලකට වසර එකක් දෙකක් වාසය කළහැකි ඉක්මණින් එකලස්කිරීමේ හැකියාවකින් සමන්විත, ප්‍රමාණවත් සන්ක්‍රාන්ති නිවහනක් නිර්මාණය කෙරිණි. සංවර්ධිත මෙම නිවහන අඩු පිරිවැයකින් යුත් වාසය සඳහා උචිත ස්වභාවික විපත්වලට ඔරොත්තු දෙන පවතින පරිසරයට අවම බලපෑමකින් යුක්ත වේ.

ශ්‍රී ලංකාවේ කළු ගඟ ද්‍රෝණියේ නායයෑම් සිදුවීම සඳහා වර්ෂාපතන දර්ශක මත පදනම් වූ සාධනීය වර්ෂාපතන සීමාව තීරණය කිරීම



කළුතර දිස්ත්‍රික්කයේ නායයෑම් සිදුවූ දිනය/වේලාව සහ වර්ෂාපතන දර්ශක අතර සම්බන්ධතාවය විමර්ශනය කිරීම සඳහා මෙම අධ්‍යයනය සිදුකරන ලදී. පෙර සිදුවීම්වල අධ්‍යයනය අනුව නායයෑම් සක්‍රීය වීමට අඩු සමුච්ඡිත වර්ෂාපතනයක් සහිත ඉහළ තීව්‍රතාවයකින් යුත් වර්ෂාපතනයකින් හෝ ඉහළ සමුච්ඡිත වර්ෂාපතනයක් සහිත අඩු තීව්‍රතාවයකින් යුත් වර්ෂාපතනයක් මගින් සිදුවන බව හඳුනාගන්නා ලදී. එබැවින් දීර්ඝ කාලීන හා කෙටි කාලීන වර්ෂාපතන දර්ශක සංකලනයෙන් ආනුභවික ප්‍රවේශයක් තුලින් කළාපයට ආවේණික වර්ෂාපතන සීමාවන් තීරණය කිරීම කෙරෙහි අවධානය යොමුකරන ලදී. පාංශු ජල දර්ශකය (SWI), පැය 72 ක සක්‍රීය වර්ෂාපතනය, පැය 72 සහ පැය 24 ක සමුච්ඡිත වර්ෂාපතනය දිගු කාලීන වර්ෂාපතන දර්ශකයක් ලෙස භාවිතා කරන අතර පැය 1.5 ක අර්ධ කාලීන සක්‍රීය වර්ෂාපතනය සහ පැයක වර්ෂාපතනය කෙටි කාලීන වර්ෂාපතන දර්ශක ලෙස භාවිතා කරයි.



ලබාගත් ප්‍රතිඵල අනෙක් දර්ශක හා සසඳන විට පාංශු ජල දර්ශකය (SWI) සහ පැය 1.5 ක සක්‍රීය වර්ෂාපතනය සමඟ වඩාත් ඒකාකාරී රටාවක් පෙන්නුම් කරයි. පූර්ව අනතුරු ඇඟවීමේ නිරවද්‍යතාව වර්ධනය කිරීම සඳහා පාංශු ජල දර්ශකය (SWI) සහ පැය 1.5 ක සක්‍රීය වර්ෂාපතන අගයන් සංකලනය ඵලදායී බව අධ්‍යයනය මගින් තහවුරු විය. තව ද, මහා පරිමාණ නායයෑම් සිදුවී ඇත්තේ ඉහල පාංශු ජල දර්ශක (SWI) අගයක දී බව සනාථ වී ඇති මුත් අඩු පාංශු ජල දර්ශක (SWI) අගයන් හි දී පවා කුඩා පරිමාණයේ බෑවුම් බිඳවැටීම් සිදුවී ඇත. කළු ගංගා ද්‍රෝණිය ආශ්‍රිත ව නායයෑම් සක්‍රිය වී ඇත්තේ අගය 80 ට ඉහළ 1.5 ක අර්ධ කාලීන සක්‍රීය වර්ෂාපතනය හා ප්‍රදේශය ආශ්‍රිත 140 සිට 300 දක්වා වූ පාංශු ජල දර්ශක (SWI) අගයන් ගත් ස්ථානයන් තුල ය. එසේ නමුත් අධ්‍යයනයේ අගයන් මත පමණක් පදනම් ව නිශ්චිත හා තීරණාත්මක අගයන් නිර්ණය කිරීම අසීරු ය. මේ අනුව නායයෑම් සක්‍රිය වීම සඳහා පාදක වර්ෂාපතනය නිර්ණය කිරීම සඳහා සහ වර්තමාන පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය වර්ධනය කිරීම සඳහා තවදුරටත් නායයෑම් හා වර්ෂාපතන වාර්තා අනුව පර්යේෂණ සිදුකළ යුතු ව ඇත.

කුඩා වැව් ආශ්‍රිත පරිසර පද්ධතිවල ජල විද්‍යාත්මක කාර්යයන් සහ තිරසාර ජල කළමනාකරණ සතු කාර්යභාරය

කුඩා වැව් ප්‍රතිසංස්කරණය සඳහා සාක්ෂි පදනම් කරගත් තාක්‍ෂණික මාර්ගෝපදේශ සකස් කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. ශ්‍රී ලංකාවේ වියළි කළාපය තුල වඩාත් තීරණාත්මක ජල කළමනාකරණ ඒකකය වැව (Tank) ලෙස සැලකේ. පෞරාණික වැවක ඉදිකිරීම් සැළැස්ම අනුව ජල සංරක්‍ෂණය සඳහා අනන්‍ය හා අද්විතීය ජල පාරිසරික කළාප (HEZ) ඇතුලත් වේ. මෙම කාර්යයන් අතර වියළි කාලවල දී වාශ්පීකරණය නිසා සිදුවන හානි පූර්ණය සහ ඒ සඳහා ජලය රඳවා ගැනීම කළාපයේ තිරසාර ජල කළමනාකරණයේ වැදගත් සාධකයකි. මෙම පර්යේෂණය මගින් අනුරාධපුරයේ තෝරාගත් වැව් ආශ්‍රිත (කුංචිකුලම සහ හිරිපිටියාගම) ජල පාරිසරික කළාප (HEZ) පිළිබඳ අධ්‍යයනය සිදුකරන ලද අතර ඒ තුලින් සාක්ෂි මත පදනම් කරගත් ජලජ පාරිසරික කළාපයන්ට අදාල විචල්‍ය කාලගුණික තත්ත්වයන් යටතේ ජලය රඳවාගැනීමේ ගුණාංග හඳුනාගැනීමත් ඒ අනුව වැව් ප්‍රතිසංස්කරණය හා ඉදිකිරීම් කටයුතු සඳහා දායකවන පාර්ශවකාර ආයතනවල භාවිතය සඳහා මාර්ගෝපදේශ ලේඛනයක් සකස් කිරීම ඉලක්කගත විය.

අනුරාධපුරයේ ගෘහස්ථ ජල හිඟ තත්ත්වය මඟහරවා ගැනීම සඳහා තිරසාර වැසි ජල රැස්කිරීමේ පද්ධතිය

දීර්ඝ කාලීන නියඟයක ප්‍රතිඵල ලෙස ජලය පිළිබඳ උග්‍ර හිඟයක් ඇති වේ. ශ්‍රී ලංකාවේ වියළි කළාපයේ පවතින දිගු කාලීන ජල හිඟයන් සඳහා විසඳුමක් ලෙස “වැසි දිය අස්වනු” (RWH) උපාය මාර්ගය කෙරෙහි අවධානය යොමුකර ඇත. කෙසේ වෙතත් “වැසි දිය අස්වනු” ක්‍රියාවලිය සම්බන්ධයෙන් ප්‍රජාව තුල දැනුවත්භාවය පිළිබඳ පරිසර අධ්‍යයන හා සේවා අංශය (ESSD) විසින් සිදුකරන ලද සමීක්ෂණවල නවතම විශ්ලේෂණයන්ට අනුව පෙනී යන්නේ තවමත් මෙම ක්‍රමය ජනතාව අතර ජනප්‍රිය වී නොමැති බවකි.

ගෘහස්ථ උග්‍ර ජල හිඟය සඳහා තිරසාර විසඳුමක් ලෙස “වැසිදිය අස්වනු” (RWH) හි වැදගත්කම අවබෝධ කරගනිමින් පවත්නා පද්ධතිය සම්බන්ධ ඌනතාවයන් ක්‍රමාණුකූල ව විශ්ලේෂණය කර පද්ධතිය වඩාත් තිරසාර හා පරිශීලක හිතකාමී අයුරින් සංවර්ධනය කර ඇත.

රෙදිපිළි අපද්‍රව්‍ය භාවිතයෙන් අඩු වියදම් හරිත පෙදරේරු නිෂ්පාදන සංවර්ධනය

ඇහලුම් කර්මාන්තයෙන් ලැබෙන රබර් මිශ්‍රිත පොලියෙස්ටර් ස්පැන්ඩෙක්ස් වැනි ඉවත ලන රෙදි කැබලි අපහරණය අපහසුය. මෙම පර්යේෂණ ව්‍යාපෘතිය මගින් පොලියෙස්ටර් ස්පැන්ඩෙක්ස් කාවද්දන ලද පෙදරේරු නිෂ්පාදන අවශෝෂණ කරන ශක්තිය සහ අනෙකුත් ගුණාංගයන්ගෙන් සමන්විත ව නිපදවා ඇත. පොලියෙස්ටර් ස්පැන්ඩෙක්ස් ආශ්‍රයෙන් සංවර්ධනය කරන ලද බිම් ඇතුරු ගල් ඉතා ඉහල ශක්ති අවශෝෂණ හැකියාවක් පෙන්නුම් කරන අතර මෙම නිෂ්පාදන භාවිතයෙන් ඉදිකරන පදික වේදිකාවල ජල පාරගම්‍යතාව සාම්ප්‍රදායික සිමෙන්ති පදනම් කරගත් බිම් ඇතුරුම් ගල්වලට වඩා සිය ගුණයකින් ඉහළ ය.

සෙවිලිද්‍රව්‍ය සඳහා විකල්ප තන්තු ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධනය කිරීම



මෙම පර්යේෂණ ව්‍යාපෘතිය මගින් ඇස්බැස්ටස් තන්තු ආශ්‍රිත සෙවිලි තහඩු වෙනුවට ශක්‍ය විකල්ප කෙඳි ආශ්‍රිත සෙවිලි තහඩු නිපදවීමේ හැකියාව පිළිබඳ විමර්ශනයක් සිදුකරන ලදී. ඒ අනුව තල් කෙඳි හා කොහු කෙඳි වැනි ස්වභාවික තන්තු හා සිමෙන්ති පදනම් වූ සෙවිලි තහඩු නිෂ්පාදනය කොට ඒවායේ යෝග්‍යතාවය රසායනික ව විශ්ලේෂණය කිරීමත් කල්පැවැත්ම පිළිබඳ ගුණාංග පර්යේෂණ කිරීමත් සිදුකර ඇත.

මැටි උළු නිෂ්පාදනයේ දී මැටි වෙනුවට ආදේශකයක් ලෙස ජල පවිත්‍රකරණයේ දී නිපදවෙන අපද්‍රව්‍ය රොන් මඩ ආදේශකයක් ලෙස භාවිතයේ ශක්‍යතාව විමසා බැලීම

ශ්‍රී ලංකාවේ ජල පවිත්‍රාගාර තුල වාර්ෂික ව සැළකිය යුතු රොන් මඩ ප්‍රමාණයක් එක්රැස්වන බැවින් එසේ ජනනයවන රොන්මඩ සම්ප්‍රදායික උළු මැටි වෙනුවට යොදාගැනීමේ ඇති හැකියාව පිළිබඳ මෙම පරීක්ෂණයෙන් සිදුකරන ලදී. ඒ අනුව කාර්මික මැටි නිෂ්පාදන කම්හලක නිෂ්පාදනය කරන ලද මෙම උළු ශ්‍රී ලංකා ප්‍රමිතීන්ට අනුව පරීක්ෂා කරන ලදී.

කොන්ක්‍රීට් ජල ගබඩාකිරීමේ ටැංකි සඳහා පාවෙන අළු (Fly Ash) මිශ්‍ර සිමෙන්තිවල යෝග්‍යතාව විමසීම

පාවෙන අළු අතිරේකයක් ලෙස අන්තර්ගත සිමෙන්ති භාවිත කොන්ක්‍රීට් තුළින් විෂ සහිත මූලද්‍රව්‍ය ජලයට කාන්දුවීම පිළිබඳ ව විමසා බැලීම මෙම පර්යේෂණයේ අරමුණ වූ අතර (i) සිමෙන්ති ආදේශකයක් ලෙස භාවිතයේ දී පාවෙන අළු අන්තර්ගතයෙහි බලපෑම සහ (ii) ජල සිමෙන්ති අනුපාතයේ බලපෑම යන අවස්ථා සලකා බැලීම සිදු විය. සිලින්ඩරාකාර මෝටාර් නිදර්ශක නියැදි, නියැදි සැකසීම පිළිබඳ NEN 7375:2004 පිරිවිතරයන්ට අනුව සිදුකරන ලද අතර පාවෙන අළු අන්තර්ගත සිමෙන්ති වෙනුවට සාමාන්‍ය පෝට්ලන්ඩ් සිමෙන්ති ආදේශ කරන ලදී. අවසන් වශයෙන් කාන්දු සංඝටක, පානීය ජලය පිළිබඳ ව ශ්‍රී ලාංකීය පිරිවිතරයන් සමඟ සසඳන ලදී.

ව්‍යුහාත්මක නායයෑම් අවමකිරීමේ ක්‍රියාමාර්ග සඳහා සමාජ බලපෑම තක්සේරු කිරීම (SIA) සිදුකිරීමේ ක්‍රමවේදයක් සැකසීම

නායයෑමට ලක්වූ ප්‍රදේශවල ව්‍යුහාත්මක නායයෑම් අවමකිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන සමාජ බලපෑම් තක්සේරු කිරීමේ ක්‍රියාවලිය සිදුකිරීමේ ක්‍රමවේදය සංවර්ධනය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ උපදේශකයන් සමඟ ඒකාබද්ධ ව මෙම පර්යේෂණ ව්‍යාපෘතිය සිදුකරන ලදී. කළුතර දිස්ත්‍රික්කයේ අත්වැල්තොට නායයෑමට ලක්වූ ප්‍රදේශයේ සිදුකරන ලද නියාමක අධ්‍යයනයක් අනුව කෙටුම්පත් ක්‍රමවේදයක් සකස්කර පරීක්ෂණ කරන ලදී. ව්‍යාපෘතිය අඛණ්ඩ ව ඉදිරියට කරගෙන යාම සඳහා සත්‍යාපන අධ්‍යයනයක් ඉදිරි වසර සඳහා සැළසුම්කර ඇත.

ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශවල වාතයෙහි ගුණාත්මකභාවය පිළිබඳ පුරෝකථනය සහ සූදානම් වීමේ පද්ධතිය සඳහා තත්‍ය කාලීන වායු තත්ත්ව අධීක්ෂණ ජාලය සංවර්ධනය කිරීම





ජා. ගො. ප. සංවිධානය විසින් කැලිෆෝනියාවේ වායු සම්පත් මණ්ඩලයේ ආචාර්ය අජිත් කඩුවෙල මහතාගේ මඟපෙන්වීම යටතේ වාතයෙහි ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීම සඳහා සංවේදක සකස් කරන ලද අතර 2018 වසරේ දී වාතයේ ගුණාත්මකභාවය පිළිබඳ තත්‍යකාලීන අධීක්ෂණය සඳහා ස්ථානයක් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තු පරිශ්‍රයෙහි ස්ථාපනය කරන ලදී. මෙම කටයුතු 2019 වසර තුළ දී ද ආචාර්ය කඩුවෙල මහතාගේ වැඩිදුර මඟපෙන්වීම යටතේ තවදුරටත් සිදුවේ. බීටා අවධාන නියාමනයට (BAM) එදිරි ව දියුණුකරන ලද සංවේදකවල ක්‍රියාකාරිත්වය ජා. ගො. ප. සංවිධානය විසින් තහවුරුකර ඇති අතර ප්‍රතිඵල ජා. ගො. ප. සංවිධානයේ වාර්ෂික සමුළුවේ දී ප්‍රකාශයට පත්කර ඇත.

සමුළු

ජා. ගො. ප. සංවිධානයේ වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය

දේශීය හා විදේශීය පාර්ශ්වකරුවන් ගේ සහයෝගීත්වයෙන් සිදුකරන ලද පර්යේෂණ සහ සහයෝගීතා වැඩවල ප්‍රතිඵල 2019 දෙසැම්බර් මස 17 සහ 18 යන දිනවල “සමානාත්මතාවයට ඔරොත්තු දීමේ හැකියාව” යන තේමාව යටතේ කොළඹ දී පවත්වන ලද ජා. ගො. ප. සංවිධානයේ 10 වන වාර්ෂික පර්යේෂණ සමුළුවේදී ඉදිරිපත් කර ප්‍රකාශයට පත් කරන ලදී.

සම්මන්ත්‍රණයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී.එච්. කමල් ගුණරත්න මහතා සමාරම්භක සැසියේ දී රැස්ව සිටි පිරිස ඇමතූ අතර ඒ මහතා කියා සිටියේ, ඔරොත්තු දීමේ හැකියාව මත පදනම් වූ තිරසාර සංවර්ධනයක් ස්වභාවයෙන්ම පුළුල් විය යුතු බවත්, එයට සංකීර්ණ අභියෝගයන්ට ඒකාබද්ධ ප්‍රතිචාර අවශ්‍ය බවත් ජාතික හිමිකම සහ නායකත්වයට ගරු කළ යුතු බවත්ය.

ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ කොළඹ රාජකීය නෝර්වීජියානු තානාපති කාර්යාලයේ තානාපති, ගරු ට්‍රයිනි ජෙරන්ලි එස්කෙඩාල් මහත්මිය විසින් පසුගිය වසර 7ක කාලය තුළ නෝර්වීජියානු භූ තාක්ෂණික ආයතනය සහ ජා. ගො. ප. සංවිධානය අතර තාක්ෂණික සහයෝගීතාව සහ එමඟින් ලබාගත් වටිනා ප්‍රතිඵලයන් ඉස්මතු කළා ය. දේශගුණික විපර්යාස බලපෑම් අවම කිරීම සහ දේශගුණික විපර්යාස සහ අනෙකුත් ස්වාභාවික විපත් වැළැක්වීම සහ මානුෂීය උත්සාහයන්හි අවශ්‍යතාවය අතර පැහැදිලි සම්බන්ධයක් ඇති බව තානාපති එස්කෙඩාල් තවදුරටත් අවධාරණය කළේය.

එක්සත් රාජධානියේ සල්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු හා පරිසර THINKlab විද්‍යා පාසලේ අධ්‍යක්ෂ, මහාචාර්ය ටෙරන්ස් ප්‍රනාන්දු මහතා විසින් ‘සමානාත්මතාවයට ඔරොත්තු දීමේ හැකියාව සඳහා තාක්ෂණය වැඩිදියුණු කළ අනුවර්තන පාලනය’ යන මාතෘකාව යටතේ ප්‍රධාන දේශනය පැවැත්වීය.

දෙවන දිනයේ ප්‍රධාන ආරාධිත අමුත්තා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය රංජිත් දිසානායක මහතා වූ අතර, ඔහු සමුළුව අමතමින් ප්‍රකාශකර සිටියේ තමා අතීතයේ දී ජා. ගො. ප. සංවිධානය සමඟ ශක්තිමත් ක්‍රියාකාරී සම්බන්ධතාවයක් ඇතිකරගත් බවත්, පරිසරය සංවර්ධනය කර ගොඩනැගීමට හා පර්යේෂණ සඳහා දායකත්වය ලබාදුන් බවත් ය. රට තුල තිරසාර සංවර්ධනය සඳහා දායකවීමටත් ඔරොත්තුදීමේ හැකියවකින් යුත් ගොඩනැගිලි ඉදිකිරීම් සඳහාත් පර්යේෂණ නියෝජිතායතනවලට හැකියව පවතින බවත්, තිරසාරභාවය ළඟාකර ගැනීම සඳහා ගොඩනගන පරිසරය තුල නව මෙවලම් අවශ්‍යකර ඇති බවත් අවධාරණය කරන ලදී. ජා. ගො. ප. සංවිධානය වෙත මෙම කරුණ සම්බන්ධයෙන් අවධානය යොමුකරන ලෙස ඉල්ලා සිටි අතර නාගරික සංවර්ධන අමාත්‍යාංශය වඩාත් තිරසාර ආකාරයෙන් නගර සංවර්ධනය කිරීමේ කටයුතු සඳහා ජා. ගො. ප. සංවිධානය සමඟ එක් ව කටයුතු කිරීමට අපේක්ෂා කරන බව ද වැඩිදුරටත් සඳහන් කරන ලදී.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ අංශ ප්‍රධානි, ආචාර්ය ජයලත් එදිරිසිංහ මහතා විසින් සිදුකරණ ලද විශේෂ දේශනයක දී සඳහන් කලේ පේරාදෙණිය විශ්වවිද්‍යාලය ජා. ගො. ප. සංවිධානය සමඟ කටයුතු කිරීමේ දීර්ඝ ඉතිහාසයක් පවතින බවකි. රටතුල නායයෑම් අනතුරු තක්සේරු කිරීමේ ක්‍රියාවලියෙහි ප්‍රයෝජනවත් බව පැහැදිලි ව අවධාරණය කරන ලද අතර ජා. ගො. ප. සංවිධානය මඟින් සිදුකරනු ලබන කටයුතු තුලින් ලබාගන්නා ප්‍රතිඵල ඉහල නිරවද්‍යතාවයකින් වන බවත් එම පර්යේෂණවල ප්‍රතිඵල සංවර්ධන කටයුතු සඳහා භාවිතා කළයුතු බවත් ඔහු සඳහන් කළේ ය.

ජා. ගො. ප. සංවිධානය සහ JICA තාක්ෂණික සහයෝගිතාව යටතේ ක්‍රියාත්මක SABO ව්‍යාපෘතියේ කණ්ඩායම් නායක ටෝරු කොයිකි මහතා විසින් “ජපානයේ අවසාදිත ආපදා අවදානම අවමකිරීම සඳහා මෘදු මැදිහත්වීම” යන මාතෘකාව යටතේ දෙවන දින ප්‍රධාන දේශනය පවත්වන ලදී. ජපානයේ නායයෑම් සම්බන්ධ පොදු වර්ගීකරණ පිළිබඳ ව පැහැදිලි කරන ලද අතර ඇතැම් කඳුකර බෑවුම් ප්‍රදේශ ගංවතුර හා නායයෑම් ඇතිකරමින් වේගයෙන් පිරිහීමට පත්වන බවත් ඉදිකිරීම් සඳහා යෝග්‍ය ඉඩම් ඉල්ලුමක් සහිත සම්පතක් බව ද ඒ අනුව ජපාන රජය විසින් වැදගත් පනත් කිහිපයක් හඳුන්වා දී ඇති බව ද පැවසී ය. ඒවා නම්, ඛාදනය පාලනය කිරීමේ පනත, නායයෑම් වැලැක්වීමේ පනත, බෑවුම් වැලැක්වීමේ පනත හා උස්බිම් ප්‍රදේශවල උපද්‍රව පාලනය සඳහා වන කහ කළාප පාලන පනත වේ.

මණ්ඩල සාකච්ඡා

ප්‍රථම මණ්ඩල සාකච්ඡාව වාර්ෂික සමුළුවේ, “ශ්‍රී ලංකාවේ ප්‍රතිරෝධක සඳහා කේත” සම්බන්ධයෙන් විය. සැසිවාරයට සමාරම්භක කථනය ජාත්‍යන්තර කේත කවුන්සිලයේ තිරසාරකරණ වැඩසටහන් පිළිබඳ විධායක අධ්‍යක්ෂ, ඩේවිඩ් වෝල්සි මහතා විසින් සිදුකරන ලදී. මණ්ඩල උපපාලක ලෙස මොරටුව විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ප්‍රියාන් ඩයස් මහතා කටයුතු කළ අතර අනෙකුත් මණ්ඩල සභිකයන් ලෙස ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) අධ්‍යක්ෂ ජනරාල්, වාස්තු විද්‍යාඥ, එච්. කේ. බාලචන්ද්‍ර මහතා, ජා. ගො. ප. සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල්, ඉංජිනේරු (ආචාර්ය) ආසිරි කරුණාවර්ධන මහතා, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කතිකාචාර්ය, ආචාර්ය කුෂාන් විජේසුන්දර මහතා සහ මොරටුව විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, සී. ජයසිංහ මහතා යන අය සහභාගී විය.

දෙවන මණ්ඩල සාකච්ඡාව “සාධාරණ අවමකරණය” යන තේමාව යටතේ සල්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ නාගරික ප්‍රතිරෝධය සහ අනුවර්තනය පිළිබඳ මහාචාර්ය බින්ගුනාත් ඉංගිරිගේ මහතාගේ මණ්ඩල උපපාලනත්වය යටතේ සිදුවූ අතර “අවමකරණ උපායමාර්ග තුළින් නායයෑම් අවදානම් අවමකිරීමේ ව්‍යාපෘතියෙහි අධ්‍යක්ෂ, ආර්. එම්. එස්. බණ්ඩාර මහතා, ජාතික සැළසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, එම්. එෆ. ඒ. මුබාරක් මහතා, ලෝක බැංකු ජ්‍යෙෂ්ඨ විපත් අවදානම් කළමනාකරණ විශේෂඥ, සුරංග කහඳව, සීමාසහිත නිපෝන් කෝයි ඉදිකිරීම් සමාගමේ පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ ප්‍රධාන ඉංජිනේරු, ආචාර්ය සෙන්රෝ කුරාඕකා මහතා, සීමාසහිත නිටොක් ඉදිකිරීම් සමාගමේ ටෝකියෝ ශාඛාවේ වෙළෙඳ හා අලෙවිකරණ දෙපාර්තමේන්තුවේ උප දෙපාර්තමේන්තු කළමනාකාර ඔමුරා ටොමෝකි මහතා සහ ELS ආයතනයේ සාමාන්‍යාධිකාරී, මහින්ද රත්නසිරි මහතා සෙසු මණ්ඩල සභිකයන් විය.

තෙවන මණ්ඩල සාකච්ඡාව “ඔරොත්තු දෙන පරිසරය” යන තේමාව ඔස්සේ ශ්‍රී ලංකා විද්‍යා තාක්ෂණ හා නව නිපැයුම් කොමසාරිස් (COSTi) සභාපති, සම්බන්ධීකරණ ලේකම්, මහාචාර්ය අජිත් ද සිල්වා මහතාගේ උප පරිපාලනත්වය යටතේ පවත්වන ලදී. ජා. ගො. ප. සංවිධානයේ පරිසර අධ්‍යයන හා සේවා අංශයේ ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ, සරත් ප්‍රේමසිරි මහතා, සෞඛ්‍ය අමාත්‍යාංශය පාරිසරක හා වෘත්තීය සෞඛ්‍ය අධ්‍යක්ෂ කාර්යාලයේ අධ්‍යක්ෂ ආචාර්ය, එස්. ජී. ඒ. ටී. සිරිවර්ධන මහතා, පරිසර හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශයේ වායු සම්පත් කළමනාකරණ හා ඕසෝන් ඒකකයේ අධ්‍යක්ෂ, සුගත් ධර්මකීර්ති මහතා සහ මොරටුව විශ්වවිද්‍යාලයේ යාන්ත්‍රික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කතිකාචාර්ය, ආචාර්ය ඒ. ජී. ටී. සුගතපාල මහතා සෙසු මණ්ඩල සභිකයින් විය.

තාක්ෂණික පත්‍රිකා ඉදිරිපත් කිරීම

ව්‍යුහාත්මක තාක්ෂණික සැසිවාර 4 ක් පිළිවෙලින් ආචාර්ය, යූ. පී. නවගමුව මහතා, මහචාර්ය ටෙරන්ස් ප්‍රනාන්දු මහතා, මහාචාර්ය එස්. එම්. ඒ. නානායක්කාර මහතා සහ එන්. එම්. එස්. අයි. අරඹෙපොල මහතා යන මහත්වරුන්ගේ සභාපතීත්වයෙන් පවත්න ලද අතර එහිදී අදාල

කතුවරුන් විසින් පිළිවෙලින් තාක්‍ෂණික පත්‍රිකා පහත තේමාවන් යටතේ ඉදිරිපත් කරන ලදී.

- ඔරොත්තු දෙන ඉදිකිරීම් පුහුණුවීම
- ඔරොත්තුදීමේ හැකියාව සහ දත්ත හුවමාරුව
- ඔරොත්තුදීමේ හැකියාව සඳහා නැවත සකස් කිරීම
- තිරසාර ඔරොත්තුදීමේ හැකියාව

තාක්‍ෂණික සැසිවාරයන් තුලින් අදහස් හුවමාරු කරගැනීමට සහ අත්දැකීම් හුවමාරු කරගැනීම සඳහා විශිෂ්ඨ වේදිකාවක් සකසන ලද අතර එමඟින් සමුළුව ඉතා සාර්ථක විය.

ජා. ගො. ප. සංවිධානයේ ප්‍රකාශන සහ වෙබ් ද්වාරයන් දියත්කිරීම

සමුළුව තුලදී ඉදිරිපත් කිරීම් 16 ක් සිදුකරන ලද අතර තාක්‍ෂණික පත්‍රිකා 48 ක් ප්‍රකාශයට පත් කිරීම සමුළුව ක්‍රියාත්මකවීම අතරතුර සිදුවිය.

මීට අමතර ව, පාර්ශවකරුවන්ට, පර්යේෂකයන්ට, වෘත්තිකයන්ට සහ සාමාන්‍ය ජනතාවට ප්‍රයෝජනවත්වන පහත දැක්වෙන ජා. ගො. ප. සංවිධානයේ ප්‍රකාශන සහ වෙබ් ද්වාර මෙම සමුළුව තුලදී දියත්කිරීම සිදුවිය.

(i) ‘MOBILISE Platform’යනු ජා. ගො. ප. සංවිධානයේ පුහුණු කිරීම් හා සංවර්ධන අංශය මඟින් බ්‍රිතාන්‍ය සල්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ THINKlab විද්‍යා පාසලේ සහාය ඇති ව සංවර්ධනය කරන ලද ගංවතුර සහ නායයෑම් මඟින් ප්‍රජාව වෙත සිදුවන බලපෑම් අවමකිරීම සඳහා එක් ව ක්‍රියාකරන බොහෝ ආයතන වෙත බුද්ධිම ය දැනුම ආශ්‍රිත යටිතල පහසුකම් සැලසිය හැකි “වෙබ් අඩවි පාදක” යෙදවුමකි.

(ii) කොළඹ මහනගර සීමාව තුල “ආපාදා ප්‍රතිරෝධී නිවාස සඳහා උප පෘෂ්ඨීක භූගෝලීය හා භූ තාක්‍ෂණික ආකෘතියක්” වෙබ් අඩවි ද්වාරය සඳහා සත්කාරකත්වය ලබාදීම ජා. ගො. ප. සංවිධානයේ පර්යේෂණ හා සංවර්ධන අංශය මඟින් පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස සිදුකරන ලදී.

(iii) “වායු තත්ත්ව නියාමන ජාලය” වෙබ් අඩවිය සඳහා සත්කාරකත්වය ලබාදීම ජා. ගො. ප. සංවිධානයේ RMV සහ පර්යේෂණ සහ සංවර්ධන වැඩමුළු ලෙස සිදුකරන ලදී.

(iv) නායයෑම් “අවදානම අවමකිරීම සඳහා ස්වභාව ධර්මය පදනම් කරගත් විසඳුම් පිළිබඳ අත්පොත“ ලෝක බැංකු ආධාර මත ජා. ගො. ප. සංවිධානය සහ ADPC ආයතනය විසින් සිදුකරනු ලබන ශ්‍රී ලංකාව තුල ස්වභාවය මත පදනම් නායයෑම් අවදානම් කළමනාකරණ ව්‍යාපෘතියකි.

(v) “කර්මාන්ත තුල රසායනික ආපදා අවදානම කළමනාකරණ සඳහා මාර්ගෝපදේශන සහ ශ්‍රී ලංකාවේ පහසුකම්” - රජය විසින් අරමුදල් සපයනු ලබන ශ්‍රී ලංකාවේ රසායනික ආපදා අවදානම ක්‍රමාණුකූල ව තක්සේරු කිරීම සඳහා වන ව්‍යාපෘතියකි.

(vi) “ද්‍රව්‍ය සහ නිෂ්පාදන තෝරාගැනීම සඳහා පිරිවිතරයක් සහ පරීක්‍ෂණ ක්‍රම පිළිබඳ අත්පොත - පළමු වෙළුම” පොදු ගොඩනැගිලි ද්‍රව්‍ය සහ නිෂ්පාදන ජා. ගො. ප. සංවිධානයේ පර්යෙෂණ හා සංවර්ධන වැඩසටහනකි.

(vii) “ගොඩනැගිලි පදනම් සුරක්‍ෂිත ව ඉදිකිරීම් පිළිබඳ ව භූ තාක්‍ෂණික මාර්ගෝපදේශය” - ජා. ගො. ප. සංවිධානයේ පරීක්‍ෂණ හා සංවර්ධන වැඩසටහනකි.

(viii) “ශ්‍රී ලංකාවේ ගොඩනැගිලි කඩා ඉවත් කිරීමේ කටයුතු පිළිබඳ තාක්‍ෂණික මාර්ගෝපදේශ” - ජා. ගො. ප. සංවිධානයේ පරීක්‍ෂණ හා සංවර්ධන වැඩසටහනකි.

පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු

1. ජා. ගො. ප. සංවිධානය විසින් ශ්‍රී ලංකාව තුල ආපදාවන්ට ලක්විය හැකි ප්‍රජාවන්ගේ ආපදා සඳහා පෙර සූදානම ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා පවත්වන ලද පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්

ජා. ගො. ප. සංවිධානය විසින් වාර්ෂික ව ආපදා අවදානම්වලට ලක්විය හැකි ප්‍රජාව, ආපාදාවලට ලක්විය හැකි ප්‍රදේශවල ඉදිකිරීම් කටයුතුවල නිරත පුද්ගලයින් සහ ආපාදා අවදානම අවමකිරීමේ ක්‍රියාවන්වල නිරත පුද්ගලයින් වැනි විවිධ හඳුනාගත් ප්‍රජාවන් වෙත ඔවුන්ගේ ක්‍රියකාරකම්වල හැකියාවන් ශක්තිමත් කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලබයි. ජා. ගො. ප. සංවිධානය විසින් පිළිවෙලින් 2018 වසරේ දී රු. මිලියන 3.4 ක් සහ 2019 වසරේ දී රු. මිලියන 5.0 ක් එබඳු පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා වෙන්කරන ලදී.

ජා. ගො. ප. සංවිධානය විසින් 2019 වසර තුල දී නායයෑම්වලට ලක්විය හැකි දිස්ත්‍රික්කවල ජොෂ්ඨ රාජ්‍ය නිලධාරීන් සහ තාක්‍ෂණික නිලධාරීන් දැනුවත්කිරීමේ වැඩසටහන් (වැඩසටහන් 3 ක්): නැවත පදිංචි කිරීමේ වැඩසටහනෙහි ප්‍රතිලාභීන් හා පෙදරේරුවන් දැනුවත් කිරීම (ප්‍රා. ලේ. කො.) මට්ටමේ වැඩසටහන් 19 ක්: ශ්‍රී ලංකාවේ වතු අංශයේ ආපදා තත්ත්වයන්ට ඔරොත්තු දෙන මානව ජනාවාස සැළසුම් පිළිබඳ “වැවිලි මානව සංවර්ධන භාරයේ” (PHDT) වෘත්තිකයින් දැනුවත්කිරීමේ වැඩසටහන, නායයෑමට ලක්විය හැකි දිස්ත්‍රික්කවල නිසි ඉඩම් පරිහරණ පුරුදු පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කිරීම සහ ආපදා තත්ත්වයන්ට ඔරොත්තු දෙන ඉදිකිරීම් ක්‍රමවේදයන් පිළිබඳ විශ්වවිද්‍යාල සිසුන් අතර දැනුවත්භාවය ගොඩනැගීම: සඳහා වන වැඩසටහන් ක්‍රියාවට නංවන ලදී. තව ද, ජා. ගො. ප. සංවිධානය විසින් ආපදා තත්ත්වයන්ට ඔරොත්තු දෙන නිවාස ආකෘතීන් ජාතික මට්ටමේ ප්‍රදර්ශන තුල දී ප්‍රවර්ධනය කිරීම ද සිදුකරන ලදී.

2020 වසර තුල දී ද පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් දීර්ඝ කිරීමට මෙන් ම ආරක්ෂිත ගොඩනැගිලි පරිසරයක් සඳහා ශ්‍රී ලංකාව තුල සිදුවන ඉඩම් සංවර්ධන සහ නිවාස ඉදිකිරීම සඳහා ඉඩම් තෝරා ගැනීමේ දී බොහෝ විට සිදුවන පොදු භාවිතයන්ට පටහැනි පුරුදු සඳහා ජා. ගො. ප. සංවිධානය විසින් සපයනු ලබන නිර්දේශ ප්‍රවර්ධන කිරීමටත් ජා. ගො. ප. සංවිධානය අපේක්‍ෂා කරයි. ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ ස්ථානගත කර ඇති බැවින් රටේ නිවාස ප්‍රමාණයෙහි ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීමේ වගකීම ජා. ගො. ප. සංවිධානය වෙත පැවරීම වරප්‍රසාදයක් වන අතර දැක්ම යතාර්ථයක් බවට පත්කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සියළුම DRR පාර්ශවකරුවන් අතර තාක්‍ෂණික දැනුම බෙදාහැරීමට ජා. ගො. ප. සංවිධානය උත්සාහ දරණු ඇත.

උපද්‍රව ඔරොත්තු දීමේ ඉදිකිරීම් සම්බන්ධ රජයේ නිලධාරීන් දැනුවත් කිරීම

උපද්‍රව ප්‍රතිරෝධී ඉදිකිරීම් පිළිබඳ නිවාස ඉදිකිරීමේ කටයුතුවල නියැලී සිටින පෙදරේරුවන් සඳහා පුහුණුව

වතු-අංශ නැවත පදිංචි කිරීමේ සැලසුම් පිළිබඳ වැඩමුළුව
වැවිලි මානව සංවර්ධන භාරය PHDT) සඳහා

ප්‍රතිලාභීන් දැනුවත්භාවය
ජාතික නැවත පදිංචි කිරීමේ වැඩසටහන

විශ්ව විද්‍යාල සහ පාසල් සිසුන් සඳහා උපද්‍රව ප්‍රතිරෝධී ඉදිකිරීම් සහ ඉඩම් පරිහරණ ක්‍රම පිළිබඳ දැනුවත්භාවය

උපද්‍රව ප්‍රතිරෝධී බේරුම්කරණ සැලසුම් පිළිබඳ ජාතික ආපදා සහන සේවා නිලධාරීන් සඳහා පුහුණුව

2. ශ්‍රී ලංකාව තුල භාවිතය සඳහා "තත්‍ය කාලීන පසු තත්ව නිරීක්ෂණ සංවේදක යාවත්කාලීන කිරීම පිලිබඳ පුහුණු වැඩසටහන"

කැලිෆෝනියාවේ වායු සම්පත් මණ්ඩලයේ ආචාර්ය අජිත් කඩුවෙල, මහතා විසින් තත්‍ය කාලීන වායු තත්ත්ව අධීක්‍ෂණ සංවදක ඒකකය තවදුරටත් වැඩිදියුණු කිරීම පිළිබඳ ව ජා. ගො. ප. සංවිධානයේ කාර්ය මණ්ඩලය සඳහා වැඩමුළුවක් 2019 නොවැම්බර් මස 5 දින සිට නොවැම්බර් මස 21 දක්වා පවත්වන ලදී. එකලස් කරන ලද සංවේදක ඒකකයක් පරීක්‍ෂාවට ලක්කරන ලද අතර "Beta Attenuated Technique" භාවිතා කරමින් අධිතාක්‍ෂණික සම්මත ක්‍රමයක් සමඟ හරස් පරීක්‍ෂා කිරීමෙන් දත්ත වලංගු කරන ලදී. සංවේදක ඒකක මඟින් ලබාගත් දත්ත සහ සංසරණ අත්හිටුවන ලද අංශු පදාර්ථ අධිතාක්‍ෂණය සඳහා සම්මත "Beta Attenuated Technique" ලබාගත් දත්ත අතර සැලකිය යුතු වෙනසක් නොමැති බව සංඛ්‍යාන ම ය වශයෙන් ඔප්පු විය. ප්‍රතිඵලයක් ලෙස ජා. ගො. ප. සංවිධානය විසින් දෙසැම්බර් 17 සහ 18 යන දිනවල දී ශ්‍රී ලංකාවේ කොළඹ දී පවත්වන ලද ජාත්‍යන්තර විද්‍යා සමුළුවේ දී ඉදිරිපත් කර ප්‍රකාශයට පත්කරන ලදී. 2019 නොවැම්බර් හා දෙසැම්බර් කාලය තුල මෙම සංවර්ධනය කරන ලද සංවේදක කොළඹ, කුරුණෑගල, වව්නියාව සහ පුත්තලම යන නගරවල ක්‍ෂෙත්‍ර දත්ත එකතුකිරීම සඳහා භාවිතා කරන ලදි.

3. සොබා දහම - පදනම්කරගත් නායයෑම් අවදානම් කළමනාකරණ ව්‍යාපෘතිය වැඩමුළුව 1 (2019 මැයි 30 -31)

- අවදානම් අවමකිරීම සඳහා ඉංජිනේරු ම ය සහ ජෛව ඉංජිනේරු ක්‍රම (සහ දෙමුහුන් ක්‍රම)
- වෘක්ෂලතා ආදිය මඟින් පසෙහි යාන්ත්‍රික හා ජල විද්‍යාත්මක ගුණාංග වැඩිදියුණු කිරීමේ විවිධ ක්‍රම
- සීමිත සමතුලිතතාවක් සහ සීමිත මූලද්‍රව්‍ය විශ්ලේෂණක් භාවිතා කරන පරිසණක ආකෘතියක් භාවිතාකරමින් ජෛව ඉංජිනේරු යෙදුම්වල බලපෑම ප්‍රමාණාත්මක ව තක්සේරු කිරීම
- අවදානමට ලක්විය හැකි බෑවුමක බෑවුම් ස්ථායීකරණයේ දී වෘක්ෂලතාදියෙ හි බලපෑම සහ දායකත්වය විශ්ලේෂණය කිරීමේ ප්‍රායෝගික අංශ
- නායයෑම් අවදානම් කළමනාකරණ සඳහා දෙමුහුන් (හූ ඉංජිනේරු සහ සොබා දහම පදනම් කරගත්) විසඳුම් අඩවි තෝරාගැනීම, සැළසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීම සඳහාවන ප්‍රවේශය පිළිබඳ ව අවබෝධය
- බෑවුමක පිහිටි ශාඛ මුල් යාන්ත්‍රික ව සළකා බැලීම
- කඳු බෑවුමක විවිධ සංයුතීන් හි ශාඛ මූල දායකත්වය සහ අස්ථායී බෑවුම්වල මූල ශක්තිමත් කිරීම ආකෘතීකරණය කිරීම පිළිබඳ යම් අදහසක්
- තායිවානයේ සිද්ධි අධ්‍යයනය තුලින් සොබා දහම පදනම්කරගත් විසඳුම් ඇතුලත් නායයෑම් අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම්වල සීමාවන් සහ අභියෝග

මෙම වැඩමුළුවේ දී සාකච්ඡාවට බඳුන් විය.

වැඩමුළු -2 (2019 ඔක්තෝම්බර් 21)

(i) නායයෑම් අවදානම් කළමනාකරණය සඳහා සොබා දහම පදනම් කරගත් විසඳුම් භාවිතා කිරීම පිළිබඳ මාර්ගෝපදේශ ලේඛන සමාලෝචනය කිරීම

(ii) උප පාංශු සැකැස්ම ශක්තිමත් කිරීමේ දී සහ බෑවුම් ස්ථායිතාව වැඩි දියුණු කිරීමේ දී වෘක්ෂලතාදියෙ හි බලපෑම මුල් පරීක්ෂා කිරීම හා ආකෘතිකරණය

ප්‍රධාන උපදේශන ව්‍යාපෘති

ඉදිකිරීම් ව්‍යාපෘතිවල භූ තාක්ෂණික ගැටළු ඉවත්කිරීම

පුළුල් කැණීම් හා අත්තිවාරම් කටයුතු සිදුකරන යාබද ගොඩනැගිලිවලට අහිතකර බලපෑම් ඇතිකල හැකි උස් ගොඩනැගිලි සහ ගොඩනැගිලි සංකීර්ණ ඉදිකිරීමේ ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබාගැනීමට පෙර, නාගරික සංවර්ධන අධිකාරිය සහ සංචාරක මණ්ඩලය වැනි අධිකාරීන් විසින් සිදුකරනු ලබන ඉල්ලීම් පරිදි ජා. ගො. ප. සංවිධානය මඟින් පර්යේෂණයන් සිදුකොට වාර්තා ඉදිරිපත් කිරීම සිදුකරයි.

වර්ෂය	2017	2018	2019
වාර්තා සහ අළුත්කිරීම් ගණන	32	38	20

ගොඩනැගිලි සඳහා තත්ත්ව වාර්තා නිකුත්කිරීම

ගොඩනැගිලිවල තත්ත්වය සහ ඒවායේ ව්‍යුහාත්මක අඛන්ඩතාව තක්සේරු කිරීම සඳහා ජා. ගො. ප. සංවිධානය විසින් පරීක්ෂණ පවත්වනු ලබන අතර ගාස්තු පදනම්කරගත් සේවාවක් ලෙස අදාල වාර්තා නිකුත් කිරීම සිදුකරයි. මෙම සේවාව සේවාදායකයන්ගේ ඉල්ලීමක් අනුව හෝ අධිකරණ නියෝගයන්ට අනුව සිදුකරනු ලබයි. යාබද දේපලවල සිදුකරන ඉදිකිරීම් කටයුතු හේතුවෙන් ගොඩනැගිලිවලට සිදුවන හානිය තක්සේරු කිරීම සඳහා බොහෝ විට එවැනි සේවාවන් අවශ්‍ය වේ. මෙම ක්‍රියාවලිය සැළකිය යුතු දීර්ඝ කාලයක් පුරා ජා. ගො. ප. සංවිධානය විසින් සිදුකරනු ලබන අතර ඒ පිළිබඳ පහත වගුව මගින් විස්තර සපයයි.

වර්ෂය	2015	2016	2017	2018	2019
වාර්තා ගණන	42	60	148	116	124

ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගරවල වායුගෝලීය වායු ගුණාත්මකභාවය අධ්‍යයනය

ජා. ගො. ප. සංවිධානය ශ්‍රී ලංකාවේ ප්‍රධාන නාගරික නගරවල වායුගෝලීය වායු ගුණාත්මකභාවය පිළිබඳ අධ්‍යයනයන්, උදාසීන වායුගුණාත්මකභාවය අධීක්ෂණ තාක්ෂණය භාවිතයෙන් දිගින් දිගටම සිදුකරන ලදී. කොළඹ, ගම්පහ, හොරණ, රත්නපුර, ගාල්ල හා කළුතර යන නගරතුල VETT වැඩසටහන යටතේ 2012 වර්ෂයේ දී SO_2 සහ NO_2 අධීක්ෂණ කටයුතු ආරම්භකරන ලදී. පසුව අධීක්ෂණය මහනුවර, කුරුණෑගල, අනුරාධපුරය සහ පුත්තලම දක්වා දීර්ඝ කරන ලද අතර PM 2.5 නියැදිකරණ වැඩසටහන ද හඳුන්වා දෙන ලදී. එකතුකරන ලද දත්තයන් ජා. ගො. ප. සංවිධානයේ වායු තත්ත්ව දත්ත පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා භාවිතා කරන ලදී.

ප්‍රධාන භූ තාක්ෂණික උපදේශන ව්‍යාපෘතීන්

දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීම (තාක්ෂණික යෝජනාව - බෑම් මඟින් බැවුම් ස්ථායිතාව කි.මී. 19 + 000 ආසන්නව - සේවාදායකයා: මාර්ග සංවර්ධන අධිකාරිය)

දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීම උසස් අධ්‍යාපන හා අධිවේගී මාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘතියකි. ජා. ගො. ප. සංවිධානය විසින් කි. මීටර් 19+000 ආසන්න කැපුම් බෑවුම සඳහාවන කැපුම් බෑවුම් ස්ථායිතාව සඳහාවන තාක්ෂණික යෝජනාව ඉදිරිපත් කරන ලදී. මේ සම්බන්ධයෙන් අස්ථායී පස හඳුනාගැනීමේ වැදගත්කම, ගල් හෝ ප්‍රදේශයේ අසාර්ථක විය හැකි වැඩිදියුණු කළ යුතු පිහිටීම් පිළිබඳ ව අවධානය කරන ලදී.

අනෙකුත් ආදායම් උත්පාදක ක්‍රියාකාරකම්

ජා. ගො. ප. සංවිධානය විසින් අඛන්ඩ ව තාක්‍ෂණික පරීක්‍ෂා කිරීම් සහ උපදේශන සේවා, නායයෑම් අධ්‍යයනයන් හා සේවා, තාක්‍ෂණික ඉංජිනේරු ව්‍යාපෘති කළමනාකරණ සේවා, ගොඩනැගිලි ද්‍රව්‍ය, මානව නැවත පදිංචි කිරීමේ සැලසුම් කිරීම් සහ පාරිසරික කළමනාකරණය යන කටයුතු සිදුකල අතර ආයතනයේ මූල්‍ය ශක්‍යතාවය ශක්තිමත් කිරීම සඳහා අඛන්ඩ ව ක්‍රියාකර ඇත. ජා. ගො. ප. සංවිධානය මඟින් සපයන ලද පරීක්‍ෂණ සහ උපදේශන සේවාවන් පහතින් සාරාංශ ගතකර ඇත.

ක්‍රියාකාරකම්/අංශය	උපදේශන සේවා ගණන	පර්යේෂණ සේවා ගණන	උත්පාදනය කර ඇති මුළු ආදායම (රු. මි.)
නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමනාකරණ අංශය	7601	-	125.87
භූ තාක්‍ෂණික ඉංජිනේරු සහ පරීක්ෂණ අංශය	170	189	235.34
පරිසර අධ්‍යයන හා සේවා අංශය	2	622	72.85
ගොඩනැගිලි ද්‍රව්‍ය පර්යේෂණ හා පරීක්ෂණ අංශය	-	3431	40.65
ව්‍යාපෘති කළමනාකරණ අංශය	124	23	48.63
මානව ජනාවාස සැලසුම් හා පුහුණු අංශය	5	-	42.38
වෙනත් ආදායම්	-	-	53.12
එකතුව			**618.84**

විදේශීය සමඟ / ප්‍රදාන සහයෝගීතා ව්‍යාපෘති

ජා. ගො. ප. සංවිධානය - JICA තාක්‍ෂණික සහයෝගීතා ව්‍යාපෘති (විදේශ ආධාර සහ තාක්‍ෂණික සහයෝගිතා)

➢ **නායයෑම් අවමකිරීම සඳහා තාක්‍ෂණික සහයෝගීතා ව්‍යාපෘතිය (TCLMP-අදියර I & II)**

උපද්‍රවකාරී අඩවි 4ක අවමකිරීමේ කටයුතු (බදුලුසිරිගම නායයෑම් අඩවිය, උඩුදුම්බර, මහනුවර සහ අලගුමලේ පාෂාණ පතිතවන අඩවිය) නායයෑම් අවමකිරීම සඳහා තාක්‍ෂණික සහයෝගිතා ව්‍යාපෘතිය (TCLMP) අදියර 1 යටතේ JICA ආයතනයේ සහයෝගිතාවය සහිත ව සම්පූර්ණ කර ඇත. ව්‍යාපෘතියෙහි කටයුතු ජා. ගො. ප. සංවිධානය විසින් ඉටුකරන ලද අතර කොයිවා කෝපරේෂන් ඇන්ඩ් අර්ත් සිස්ටම් සයන්ස් ලිමිටඩ් සහ නිපෝන් කොයි සමඟ උපදේශක වශයෙන් කටයුතු කරන ලදී.

TCLMP ව්‍යාපෘතියේ අදියර II ලෙස SABO ව්‍යාපෘතියේ වසර 3ක ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කරන විශේෂිත උපද්‍රව සිතියම්ගත කිරීම සහ අවදානම් තක්සේරු කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කරමින් ශ්‍රී ලංකාවේ නායයෑම් අවදානම අවමකිරීම සඳහා ව්‍යුහාත්මක නොවන පියවරයන් ශක්තිමත් කිරීම අරමුණු කරගෙන ප්‍රාදේශීය මට්ටමින් නායයෑම් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම, පවත්නා නිරීක්‍ෂණ පද්ධතිය සහ ඇඟවීම් දියුණු කිරීම සහ අවසාදිත ආපදා පිළිබඳ අවදානම් තක්සේරු කිරීම්, ඉඩම් පරිහරණ සැළසුම් සහ සංවර්ධන ප්‍රමිතීන්ට අදාල කිරීම. ආරම්භයේ දී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා නියමු ස්ථාන තුනක් කෑගල්ල, බදුල්ල සහ මාතර යන ප්‍රදේශවලින් තෝරාගන්නා ලදී. ව්‍යාපෘතියේ ඉලක්කගත ප්‍රතිඵල ලබාගැනීම සඳහා පහත ක්‍රියාකාරී කණ්ඩායම් තුනක් පත්කර ඇත.

ක්‍රියාකාරී කණ්ඩායම 1 (WG1) - උපද්‍රව විශ්ලේෂණය සහ අවදානම් තක්සේරුව
ක්‍රියාකාරී කණ්ඩායම 2 (WG2) - අවසාදිත ආපදා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය
ක්‍රියාකාරී කණ්ඩායම 3 (WG3) - ඉඩම් පරිහරණ සැළසුම් හා සංවර්ධන ප්‍රමිති

පළමු ක්‍රියාකාරී කණ්ඩායම (WG1) යටතේ පහත ක්‍රියාකාරකම් සිදුකරන ලදී. නායයෑම් අවදානම් කළාප සිතියම්ගත කිරීම හා අවදානම් ඇගැයීම් පිළිබඳ ව වන ක්‍රමවේදය සමාලෝචනය, නායයෑම් ආපදා වාර්තා කළමනාකරණය සඳහා පද්ධතියක් වැඩිදියුණු කිරීම: පසුගිය නායයෑම් ආපදාවලට අදාල වාර්තා එකතු කිරීම හා විශ්ලේෂණය: අඩවි විශේෂිත ආපදා සිතියම්ගත කිරීම හා අවදානම් තක්සේරු කිරීම පිළිබඳ අත්පොත් කෙටුම්පත් සැකසීම, නියාමක අඩවි 3 සඳහා "රතු කළාප" සහ "කහ කළාප" සංකල්පය භාවිතයෙන් අඩවි විශේෂිත ආපදා සිතියම් සැකසීම, නියාමක අඩවි 3 සඳහා "Hyper KANAKO" ආකෘති භාවිතයෙන් නායයෑම් ගලායන මාර්ග සමාකරණය සිදුකිරීම සහ නියාමක අඩවිවලට අමතර පළාත්වල අඩවි විශේෂිත ආපදා සිතියම්ගත කිරීම. මීට අමතර ව ජා. ගො. ප. සංවිධානයේ කාර්යමණ්ඩල සඳහා පුහුණු කිරීම් වැඩමුළු සහ කුඩා සම්මන්ත්‍රණ පැවැත්වීම සිදුකරන ලදී.



මොරවක්කන්ද නියාමක අඩවිය, අඩවි විශේෂිත ආපදා සිතියම



මොරවක්කන්ද නියාමක අඩවිය, ගලායෑම් මාර්ග සමාකරණ ප්‍රතිඵල

අඩවි විශේෂිත ආපදා සිතියම් සඳහා වැඩමුළුව

සුදානම් කරන ලද අඩවි විශේෂිත අවදානම් සිතියම් සත්‍යාපනය සඳහා පවත්වන ලද ක්‍ෂේත්‍ර සමීක්‍ෂණය

➢ **නායයෑම් දුරස්ථ නිරීක්ෂණ පද්ධතියේ ජපන් තාක්ෂණයන් බෙදා හැරීම සඳහා පෞද්ගලික අංශය සමඟ සිදුකරන ලද සත්‍යාපන සමීක්ෂණය - 2017**

විභව නායයෑම් අඩවි ආශ්‍රිත ව පූර්ව අනතුරු ඇඟවීම් පද්ධතියේ උපකරණ සවිකිරීම හා සංවර්ධනය කිරීම සහ අත්‍යවශ්‍ය උපකරණ නිෂ්පාදනය සඳහා ධාරිතාවන් සංවර්ධනය කිරීම - 2015 ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමෙන් අනතුරු ව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. අඛන්ඩ ව සහ සෙමෙන් ගමන් කරන නායයෑම් හඳුනාගෙන ඇත. ඒ අනුව උචිත භූමි චලනයන් හඳුනාගැනීමේ උපකරණ භාවිතයෙන් මෙම නායයෑම් අධීක්ෂණය අත්‍යවශ්‍ය ව ඇත. මීට අමතර ව නායයෑම් සිදුවීමට හැකියාව පවතින ප්‍රදේශවල හඳුනාගත් හුදකලාව ජීවත්වන ජනතාව වාසය කරන බැවින් කොළඹ සිට සිදුකරන නායයෑම් අනතුරු හැඟවීමේ පූර්ව දැනුම්දීම සඳහා සම්බන්ධ කරගැනීමේ දුෂ්කරතා පවතී. පසුව නියාමක අඩවි තුල නායයෑම් දුරස්ථ නියාමන පද්ධති (LRMS) ස්ථාපනය කිරීම සහ ඒවා ජා. ගො. ප. සංවිධානයේ නායයෑම් පූර්ව දැනුවත් කිරීමේ මධ්‍යස්ථානය සහ ප්‍රජා පූර්ව අනතුරු හැඟවීමේ පද්ධති අවශ්‍ය ස්ථානවල ස්ථාපනය සඳහා ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. ජා. ගො. ප. සංවිධානය ජපන් රජයේ සහ JICA ආයතනයේ සහ Earth System Science Limited & Osasi Technos Limited සමඟ ඒකාබද්ධ ව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. පද්ධති හැකියා නිදර්ශනය සඳහා මුලින් ම 2015 වසරේ උපකරණ පද්ධති රත්නපුර දිස්ත්‍රික්කයේ “දියනිල්ල“ සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ “ගල්බොඩ“ යන ස්ථානවල ස්ථාපනය කරන ලදී. මෙම පද්ධති දෙක මේවන විට ක්‍රියාත්මක ව පවතී. පසුව නැඹුරුතා මාන, විස්තාරක මාන, ඩිප් මීටර්, බිම් තෙතමන සංවේදක, වර්ෂාමාපක සහ සංඥා සම්ප්‍රේෂණ උපකරණ ඇතුලත් උපකරණ පද්ධති තෝරාගත් ඉහල නායයෑම් අවදානමක් සහිත ස්ථාන කීපයක සවිකරන ලදී. මෙම ව්‍යාපෘතිය අදාල අසල්වාසී ප්‍රජාවන් වෙත ප්‍රයෝජනවත් වේ.



➢ **ඵලදායී නායයෑම් සහ ආශ්‍රිත උපද්‍රව අවමකිරීම සහ ධාරිතා ශක්තිමත් කිරීම සඳහා ව්‍යුහාත්මක සහ ව්‍යුහාත්මක නොවන ක්‍රියා මාර්ග සංවර්ධනය සහ යෙදවීම - 2019**

ජා. ගො. ප. සංවිධානය ජපානයේ ඉබරාකි, ට්සුකුබා නගරයෙහි ඉඩම් යටිතල පහසුකම් ප්‍රවාහනය සහ සංචාරක අමාත්‍යාංශයේ (MLIT), ඉඩම් සහ යටිතල පහසුකම් කළමනාකරණය සඳහා වන ජාතික ආයතනය (NILIM) සමඟ ඒකාබද්ධ ව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරයි. “NILIM “ ආයතනයේ කණ්ඩායමක් ජා. ගො. ප. සංවිධානය සහ නායයෑම් අඩවි නිරීක්ෂණයට එක් වූ අතර නායයෑම් පිළිබඳ පර්යේෂණයක් පැවැත්වීම පිළිබඳ ව සාකච්ඡා පැවැත්වීය. ජා. ගො. ප. සංවිධානයේ විද්‍යාඥයින් සඳහා අවසාදිත ව්‍යසනයන් පිළිබඳ පුහුණුවක් NILIM ආයතනය තුලින් ලබා දී ඇත.

- **ශ්‍රී ලංකාවේ වැසි මඟින් ඇතිවන වේගවත් හා දිගු ගමන් නායයෑම් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ තාක්‍ෂණ සංවර්ධනය කිරීම - 2019 2019 SATREPS (JICA)**

ජපානයේ කියෝතෝ විශ්ව විද්‍යාලයේ ජාත්‍යන්තර නායයෑම් සම්මේලනය (ICL), ලෝකයේ නායයෑම් අධ්‍යයන සඳහා ප්‍රමුඛ අධිකාරිය සහ ජා. ගො. ප. සං. ඒකාබද්ධව ජපන් රජයේ විද්‍යා හා තාක්ෂණ ඒජන්සියේ (JST) තිරසාර සංවර්ධනය සඳහා වන විද්‍යා හා තාක්ෂණ පර්යේෂණ හවුල්කාරිත්වය (SATREPS) සඳහා ජපන් රජයේ ජාත්‍යන්තර කටයුතු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකාවේ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත "වැසි ප්‍රේරිත වේගවත් සහ දිගු දුර නායයෑම් ආපදා අවදානම අවම කිරීම" ව්‍යාපෘතිය අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. මෙම පස් අවුරුදු ජපාන-ශ්‍රී ලංකා ඒකාබද්ධ ව්‍යාපෘතිය 2019-2023 කාල සීමාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලැබී ඇත. මෙම යෝජනාවලිය මඟින් වැසි ප්‍රේරිත වේගවත් හා දිගු ගමන් නායයෑම් ආපදා අවදානම අවම කිරීම" සඳහා උසස් තාක්‍ෂණය 2015-2025 තුල සෙන්ඩායි හවුල්කාරිත්වයේ ISDR-ICL ගෝලීය හවුල්කරුවන් හරහා හඳුන්වාදීමට යෝජනා කරයි. මෙම ව්‍යාපෘති කටයුතු සඳහා දේශීය හා ජපන් සහයෝගිතා සහ උපකාරක ආයතන කිහිපයක් සහභාගී වන අතර මූලික කටයුතු දැනටමත් ආරම්භ කර ඇත.

අපේක්ෂිත ප්‍රතිඵලයන්:

1. පැය 24 කට කලින් අධික වැසි පිළිබඳ සහ ගොඩනැගෙන ජල පීඩනය පිළිබඳ පුරෝකථනය කිරීමේ තාක්‍ෂණ වර්ධනය, වැසි ප්‍රේරිත වේගවත් දිගු ගමන් නායයෑම් සහ ඒවායේ චලනයවන කළාප හඳුනාගැනීමේ තාක්‍ෂණය වර්ධනය කිරීම.
2. කඳුකරයේ සහ ප්‍රාදේශීය නගරවල වාසය කරන ප්‍රජාව වෙත ඵලදායී අවදානම් සන්නිවේදනයක් සඳහා තාක්‍ෂණය සහ සැකැස්ම සංවර්ධනය
3. නියමු අධ්‍යයන ස්ථානවල ඒකාබද්ධ පර්යේෂණ මත පදනම් ව ඉහත සඳහන් කළ තාක්‍ෂණය අන්තර්ගත කිරීමෙන් වැසි ප්‍රේරිත දිගු නායයෑම් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ ක්‍රමයක් සකස් කිරීම. සංවර්ධන පද්ධතිය මාර්ගෝපදේශ හා අත්පොත් සහිත ව ශ්‍රී ලංකාවේ වෙනත් ප්‍රදේශවල භාවිත කිරීම සඳහා සැපයේ.
4. සංවර්ධනය කරන ලද ඉහත තාක්ෂණයන් මහජනතාවගේ ආරක්ෂාව සහතික කරනු ඇති අතර නායයෑම් හා ඒ ආශ්‍රිත උපද්‍රව වලින් අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් ආරක්ෂා කරනු ඇත.

- **ගොඩනැගිලි අභාවයට පත්වීම තක්සේරු කිරීම සහ සේවා කාලය දීර්ඝ කිරීම මඟින් ආපදාවලට ඔරොත්තු දීමේ හැකියාව ඇති කිරීම**

ජා. ගො. ප. සංවිධානය සහ ජයිකා ආයතනයේ (JICA) JRC සේවාවන් විසින් මෙම ව්‍යාපෘති යෝජනාව සකස් කර ඇති අතර ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබා දී ඇත. JRC සේවා විසින් අයදුම්පත් JICA වෙත ඉදිරිපත් කරනු ඇත.

ජා. ගො. ප. සංවිධානය සහ NGI තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘතිය

2013 වර්ෂයේ සිට ජා. ගො. ප. සංවිධානය සහ නෝර්වීජියානු භූ තාක්‍ෂණික ආයතනය (NGI) එක්ව භූගත ගිලා බැසීම් සහ නායයෑම් පිළිබඳ අධ්‍යයනයන් සිදු කරයි. තාක්‍ෂණික සහයෝගීතාව පිළිබඳ ගිවිසුම "දේශගුණික විපර්යාස හේතුවෙන් ස්වාභාවික විපත් අවම කිරීම සඳහා ආයතනික සහයෝගීතාව" ව්‍යාපෘතිය 2018 සිට 2022 දක්වා වසර පහක කාලයක් සඳහා අඛණ්ඩ ව පවත්වාගෙන යාම සඳහා දීර්ඝ කරන ලදී.

වසර ගණනාවක් පුරා NGI ආයතනය විසින් ජා. ගො. ප. සංවිධානයේ කාර්ය මණ්ඩලය ආයතනය තුල සහ NGI හි දී පුහුණු කිරීම තුලින් තාක්‍ෂණික හැකියාව ශක්තිමත් කිරීම සිදුකර ඇත. සෑම වසරකම NGI විශේෂඥයින් ජා. ගො. ප. සංවිධානයේ කාර්ය මණ්ඩලය සමඟ පැමිණ උසස් සමීක්ෂණ පවත්වයි. නායයෑම් සහ භූගත ගිලා බැසීම් අධ්‍යයනයන්ට අදාළ GPR ශිල්පීය ක්‍රම සහ චන්ද්‍රිකා රූප සැකසීම පිළිබඳව ජා. ගො. ප. සංවිධානයේ කාර්ය මණ්ඩලය පුහුණු කර ඇත. මීට අමතරව, NGI විසින් උප පෘෂ්ඨීය සිතියම් ගත කිරීම සඳහා දියුණු භූගත විනිවිද යාමේ රේඩාර් පද්ධතියක්, තිරස් බිම් පරිලෝකනය සඳහා විවිධ ඇන්ටනා සහ සිරස් සිදුරු ස්කෑන් කිරීම, ස්වයංක්‍රීය වැසි මාපක, ගුවන් සිතියම් ගත කිරීම සඳහා කැමරා ඩ්‍රෝන් සහ රූප සැකසුම් සඳහා විශේෂිත මෘදුකාංග සහිත වේගවත් පරිගණක ඇතුළු විවිධ උපකරණ පරිත්‍යාග කරන ලදී.

රාජකීය නෝර්වීජියානු තානාපති කාර්යාලය (RNE) මෙම ව්‍යාපෘතිය සඳහා මූල්‍යාධාර ලබා දී ඇත.

සොබා දහම පදනම් කරගත් නායයෑම් අවදානම් කළමනාකරණ ව්‍යාපෘතිය



ජා. ගො. ප. සංවිධානය සහ තායිලන්තයේ ආසියානු ආපදා පෙර සූදානම්කිරීමේ මධ්‍යස්ථානය සමඟ එක් ව ලෝක බැංකු ආධාර මත මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද අතර ව්‍යාපෘතියේ ප්‍රතිඵලයක් ලෙස “නායයෑම් අවදානම් අවම කිරීම සඳහා සොබා දහම පදනම් කරගත් විසඳුම් භාවිතාකිරීම පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය“ සම්පාදනය කරන ලදී. නායයෑම් අවදානම් අවමකරණය සඳහා ක්‍රියාමාර්ග සැළසුම් කිරීම හා සම්බන්ධ පුද්ගලයින් වෙත විශ්වාසනීය, තිරසාර, ලාභදායී නායයෑම් අවදානම් කළමනාකරණ ක්‍රමයක් ලෙස මෙම සොබා දහම පදනම් කරගත් විසඳුම් ලේඛනය මඟින් සැපයේ.

අවමකිරීමේ ක්‍රියාමාර්ග ව්‍යාපෘතිය මගින් නායයෑම් අවදානම් අවමකිරීම

කැබිනට් අනුමැතිය ලද ඒකාබද්ධ නායයෑම් අවමකිරීමේ වැසටහන තුලින් ආරම්භ වූ නායයෑම් මඟින් සිදුවිය හැකි අවදානම අවමකිරීම සඳහා අවමකිරීමේ ව්‍යාපෘතිය (RLVMMP) ජා. ගො. ප. සංවිධානය විසින් ආරම්භ කරන ලදි. මෙම විශාල ව්‍යාපෘතියට හඳුනාගත් අධි අවදානම් නායයෑම් අඩවි සහ මාර්ගාසන්නයේ වන අස්ථායී බෑවුම්, කඳුකර සහ දුම්රිය මාර්ග ඔස්සේ පිටිහි අස්ථායී බෑවුම් ආශ්‍රිත නායයෑම් වසර 3 ක කාලය පුරා අවමකිරීම ඇතුලත් වේ. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන සංරචක වනුයේ:

- සිවිල් වැඩ සහ ඒ ආශ්‍රිත සැළසුම් සහ ඉදිකිරීම් අධීක්ෂණ/ කළමනාකරණ කටයුතු
- ප්‍රතිපත්ති හා නියාමන වැඩි දියුණු කිරීම
- ආයතනික ධාරිතාව වර්ධනය
- තාක්ෂණික සහාය සහ ව්‍යාපෘති කළමනාකරණය

ඉතා ඉක්මණින් අවමකිරීමේ අවශ්‍යතාව සහිත අඩවි 147 ක් සඳහා ජා. ගො. ප. සංවිධානය විසින් පළාත් පාලන ආයතන, මාර්ග සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ඒකබද්ධ ව ප්‍රමුඛත්වය ලබා දී ඇත. අත්‍යවශ්‍ය කටයුත්තක් ලෙස 2018 වසරේ දී ව්‍යාපෘතියේ පළමු අදියර ලෙස අඩවි 27 ක් සඳහා අදාල පාරිසරික හා සමාජ බලපෑම් තක්සේරු කිරීම සහ භූ තාක්ෂණ සැළසුම් කිරීම සම්පූර්ණ කර ඇත.

2019 වසරේ දී ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ස්ථාපිත කර ප්‍රධාන කාර්ය මණ්ඩලය පත් කරන ලදී. ව්‍යාපෘතියේ (1) සංරචකයෙහි ක්‍රියාකාරකමක් ලෙස පළමු අදියර සඳහා උපදේශකයින් තෝරාගන්නා ලද අතර පළමු අදියරයෙහි ටෙන්ඩර් ලිය කියවිලි අවසන් කර ඇත. දෙවන අදියරේ දී ජා. ගො. ප. සංවිධානය විසින් දිස්ත්‍රික්ක 8 ක ක්ෂේත්‍ර 120 ක් සම්බන්ධ ක්ෂේත්‍ර සමීක්ෂණ, සවිස්තරාත්මක පරීක්ෂණාත්මක සැළසුම් කටයුතු ආරම්භ කරන ලද අතර බොහෝ ලිපි ලේඛණ ටෙන්ඩර් කිරීම සඳහා සකසා ඇත. සංරචක (2) හි ක්‍රියාකාරකම් ලෙස ලේඛන සැකසීමේ කටයුතු ආරම්භ වූ අතර සංරචක (3) හි ක්‍රියාකාරකම් ලෙස ආයතනික ශක්‍යතාව වර්ධනය සඳහා ජා. ගො. ප. සංවිධානය වෙත උපකරණ කීපයක් ලබා දී ඇත.

වාතයේ ගුණාත්මකභාවය අධීක්ෂණය සහ පාංශු තෙතමනය මැනීම සඳහා සංවේදක සංවර්ධනය කිරීම

2018 වසරේ දී කැළිෆෝනියාවේ වායු තත්ත්ව පර්යේෂණ මණ්ඩලයේ විශේෂඥයකු වන ආචාර්ය අජිත් කඩුවෙල මහතාගේ මඟපෙන්වීම යටතේ පරිසර අධ්‍යයන හා සේවා අංශයේ කාර්ය මණ්ඩලය විසින් වාතයේ ගුණාත්මකභාවය මැනීම සඳහා තත්‍ය කාලීන විශේෂිත කරුණු අධීක්ෂණ නියැදියක් සකස් කරන ලදි. 2019 වසරේ දී ආචාර්ය කඩුවෙල මහතා විසින් ජා. ගො. ප. සංවිධානයේ කාර්ය මණ්ඩලය සඳහා දේශන හා ප්‍රායෝගික සැසි මාලාවක් පවත්වමින් පරිසර අධ්‍යයන හා සේවා අංශය (ESSD) මඟින් තවදුරටත් පුහුණු කරන ලදී. මෙම සංවේදක පරීක්ෂාකර වලංගු කිරීමෙන් පසු රටේ ජනාකීර්ණ නගර කීපයක වායු ගෝලීය ගුණාත්මභාවය අධීක්ෂණය කිරීම සඳහා යොදවා ඇත. ජා. ගො. ප. සංවිධානයේ වෙබ් අඩවිය හා සම්බන්ධ විශේෂිත වෙබ් අඩවියක මෙම නගරවල වාතයේ ගුණාත්මකභාවය පෙන්වීමට ලැබෙන තත්‍ය කාලීන දත්ත භාවිතා කරයි. ජල ටැංකි ඉවුරෙහි තෙතමනය අධීක්ෂණය කිරීම සඳහා සංවේදක සහ දත්ත ලබාගැනීමේ පද්ධතිය ද මෙම අංශය විසින් සංවර්ධනය කරන ලදී.

වාතයේ ගුණාත්මකභාවය සහ පාංශු තෙතමනය සංවේදක සංවර්ධනය කිරීම

USGS සමඟ තාක්‍ෂණික සහයෝගීතා ව්‍යාපෘති

එක්සත් ජනපදයේ භූ විද්‍යා සමීක්‍ෂණ ආයතනයේ (USGS) කණ්ඩායමක් 2019 වසරේ දී ජා. ගො. ප. සංවිධානය වෙත පැමිණි අතර නායයෑම් අවදානම් කළමනාකරණය පිළිබඳ ව ජා. ගො. ප. සංවිධානය වෙත සහාය වීම සඳහා සාකච්ඡා පවත්වන ලදී. මේ සඳහාවන අවබෝධතා ගිවිසුමක් ජා. ගො. ප. සංවිධානය හා USGS අතර අත්සන් කරන ලදී. ජා. ගො. ප. සංවිධානයේ කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහනක් මෙම කණ්ඩායම විසින් පවත්වන ලදී.

කාර්මික අපද්‍රව්‍යවලින් බහු කාර්ය භූ බහු අවයවික පූර්ව ප්‍රචාරක ඒකක සංවර්ධනය

ඉන්දු - ශ්‍රී ලංකා ඒකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘතියක් ලෙස ඉන්දියාවේ සේලම් හි "සෝනා තාක්‍ෂණික විද්‍යාලය සමඟ" ජා. ගො. ප. සංවිධානය ඉහත පර්යේෂණ යෝජනාව ඉන්දියානු රජය වෙත ඉදිරිපත් කරන ලදී.

ජා. ගො. ප. සංවිධානයෙහි ප්‍රකාශන

මොනෝග්‍රාෆ්

1. "නායයෑම් අවදානම් අවමකිරීම සඳහා සොබා දහම පදනම් කරගත් විසඳුම් පිළිබඳ අත්පොත" - ලෝක බැංකුව විසින් අරමුදල් සපයනු ලබන ජා. ගො. ප. සංවිධානය සහ ADPC විසින් ශ්‍රී ලංකාවේ සොබා දහම පදනම් කරගත් නායයෑම් අවදානම් කළමනාකරණ ව්‍යාපෘතිය.
2. "කර්මාන්තයේ රසායනික ආපදා අවදානම කළමනාකරණය කිරීම සඳහා වූ මාර්ගෝපදේශය සහ ශ්‍රී ලංකාවේ පහසුකම්" - රජය විසින් අරමුදල් සපයනු ලබන ව්‍යාපෘතියක් වන ශ්‍රී ලංකාවේ රසායනික ආපදා අවදානම ක්‍රමානුකූලව තක්සේරු කිරීම.
3. "ද්‍රව්‍ය හා නිෂ්පාදන තෝරා ගැනීම සඳහා පරීක්ෂණ ක්‍රම සහ පිරිවිතරයන් පිළිබඳ අත්පොත - වෙළුම 1: පොදු ගොඩනැගිලි ද්‍රව්‍ය හා නිෂ්පාදන" - ජා. ගො. ප. සංවිධානයෙ හි පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන
4. "ගොඩනැගිලි පදනම් සුරක්ෂිතව ඉදිකිරීම පිළිබඳ භූ තාක්‍ෂණික මාර්ගෝපදේශය" - ජා. ගො. ප. සංවිධානයෙ හි පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන
5. "ගොඩනැගිලි කඩා බිඳ දැමීමේ කටයුතු පිළිබඳ තාක්ෂණික මාර්ගෝපදේශ" - ජා. ගො. ප. සංවිධානයෙ හි පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන

පුවත් පත්‍රිකා

1. NBRO Newsletter Vol 43 / May 2019 "ඔරොත්තු දීමේ හැකියාව"
2. NBRO Newsletter Vol 44 / Sep 2019 "ගොඩනැගිලි ඉදිකිරීම"
3. NBRO Newsletter Vol 45 / Dec 2019 "සම්මන්ත්‍රණ සංස්කරණය"

වෙබ් යෙදුම්

1 MOBILIZE Platform 'ප්‍රජාවන්ට ගංවතුර හා නායයෑම් වැනි ආපදාවන්ගේ බලපෑම අවම කිරීම සඳහා එක්ව කටයුතු කිරීම සඳහා විවිධ ආයතනවලට බුද්ධිය ලබා දිය හැකි ඩිජිටල් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා වන වෙබ් පාදක යෙදුමකි. - THINKlab පාසලේ සහාය ඇතිව NBRO හි R&D වැඩසටහන විද්‍යා, ඉංජිනේරු සහ පරිසර, සල්ෆර්ඩ් විශ්වවිද්‍යාලය

2 'කොළඹ මහ නගර සභාවේ ආපදා තත්වයන්ට ඔරොත්තු දෙන නිවාස සඳහා උප ප්‍රෂ්ඨීය භූ තාක්‍ෂණික ආකෘතිය' NBRO හි NBRO - R&D වැඩසටහන විසින් සත්කාරකත්වය සපයන වෙබ් ද්වාරයක්

3 NBRO - RMV සහ NBRO හි R&D වැඩසටහන විසින් සත්කාරකත්වය සපයන වෙබ් අඩවියක් වන වායු තත්ත්ව අධීක්ෂණ ජාලය

මූල්‍යමය තත්ත්වය පිළිබඳ වැදගත් කරුණු

2019 වර්ෂයේ දී ජා. ගො. ප. සංවිධානය විසින් ඒකාබද්ධ ආදායම රු. මිලියන 959.0 වාර්තා කරන ලදී. සම්ප්‍රදායික සේවා වලින් 2019 වසරේ දී ලබා ගත් අදායම රුපියල් මිලියන 618.8 කි. ආයතනය බොහෝ දුරට රඳා පවතින්නේ එහි පුනරාවර්තන වියදම් පියවා ගැනීම සඳහා උපයන ලද මෙම උපදේශන ආදායම මත ය.

2019 දී අධි අවදානම් නායයෑම් අවමකිරීම සඳහා රජයේ අරමුදල් යටතේ රුපියල් මිලියන 578.0 ක ප්‍රතිපාදන ලැබිණි. නායයෑමේ අවදානමක් පවතින දිස්ත්‍රික්කවල ඉදිකිරීම් හා සංවර්ධන කටයුතුවලට ප්‍රථමව නායයෑම් අවදානම් තක්සේරු වාර්තා (LRAR) නිකුත් කිරීමට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ දිස්ත්‍රික් කාර්යාල නමයක් 2011 මාර්තු මස සිට ස්ථාපිත කර ඇත. පුනරාවර්තන වියදම් ලෙස රු. මිලියන 28.0 ක් මහා භාණ්ඩාගාරය විසින් සපයන ලද අතර අවශ්‍ය ඉතිරිය අයදුම්කරුවන්ගෙන් අයකරන ලද නාමික ගාස්තුවලින් ද ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ ආදායමෙන් ද සපුරා ගන්නා ලදී.



මුළු මෙහෙයුම් ආදායම හා ශුද්ධ අතිරික්තය



2015 - 2019 කාලය තුළ ශුද්ධ ලාභ ඉපැයීම



ව්‍යාපෘති සඳහා රජයේ ප්‍රදානය - **2019**



පරීක්ෂණ සහ උපදේශන මගින් ආදායම



නායයාම් අවමකරණ ව්‍යාපෘතිවල ප්‍රතිපාදන 2015- 2019

ඊට අමතරව, පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා රු.මිලි 15.0 ක් සමඟ නායයෑම් ආපදා කලාප සිතියම්කරණය සඳහා රු. මි. 20ක පර්යේෂණ ප්‍රතිපාදන ද ආයතනය වෙත ලැබුණි. විශේෂ නායයෑම් පරීක්ෂණ කටයුතු සඳහා රුපියල් මිලියන 20.0 ක් ලැබුණු අතර 2019 වසරේදී වූ ආන්තික කාලගුණ තත්ත්ව හේතුවෙන් සිදු කල විමර්ශන සඳහා ලද අතිරේක රුපියල් මිලියන 35.0 ඊට ඇතුලත් ය. විද්‍යාගාරය හා ක්ෂේත්‍ර උපකරණ ප්‍රසම්පාදන සඳහා රු.මිලි 20.0 ක ප්‍රතිපාදන ද මහා භාණ්ඩාගාරය විසින් ලබා දෙන ලදී.

2019 වසර සඳහා මුළු මෙහෙයුම් ආදායම රු.මිලියන 959.0ක් වූ අතර එම කාලපරිච්ඡේදය සඳහා මුළු මෙහෙයුම් වියදම රු.මිලියන 903.8 ක් විය. ඒ අනුව රු. මිලි 55.2 ක ශුද්ධ ලාභයක් වාර්තා කරන ලදී.

2018 වසරේ දෛනිකව වැටුප් ගෙවන සේවකයන් 483 ක් වූ කාර්යමණ්ඩලය සහ පුද්ගල පඩිනඩි සඳහා වූ වියදම වූ රු.මි. 465.9 ට සාපේක්ෂව 2019 වසරේ දී දෛනිකව ගෙවීම් කරන සේවකයන් 490ක් වූ කාර්යමණ්ඩලය සඳහා පුද්ගල පඩිනඩි සඳහා වියදම රු.මි. 539.9 ක් විය.

ආයතනයේ වර්ධනය හා ඉහල කාර්යසාධනය සඳහා ප්‍රධාන වශයෙන්ම ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ කළමනාකාරිත්වය හා කාර්යමණ්ඩලයේ ධෛර්ය සම්පන්න උත්සාහය හේතු විය.

මූල්‍යමය තත්ත්ව ප්‍රකාශය

2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

රු.

		ඇමුණුම් අංකය	31.12.2019 දිනට		31.12.2018 දිනට
ජංගම වත්කම්					
මුදල් සහ ඒ ආශ්‍රිත වත්කම්		1		116,777,209	40,116,143
ලැබීමට නියමිත	ව්‍යාපෘති ණයගැතියන්	2	477,982		477,982
	විවිධ ලැබීම්	3	75,302,188	75,780,170	48,690,522
				192,557,379	89,284,647
ඉන්වෙන්ට්‍රි		4		3,965,848	3,743,181
පෙර ගෙවීම්		5		276,534,857	220,743,686
වෙනත් ජංගම වත්කම්					
	සිදුවෙමින් පවතින ව්‍යාපෘති	6	292,179,615		441,668,072
	වෙනත්	7	463,912,823	756,092,438	587,593,088
ජංගම නොවන වත්කම්				1,229,150,522	1,343,032,674
යටිතල, පිරියත සහ උපකරණ		8	670,221,382		597,301,323
නව විද්‍යාගාර ගොඩනැගිල්ල නොනිමි වැඩ			333,811,858		206,249,677
රත්නපුර ගොඩනැගිල්ල නොනිමි වැඩ			1,310,000	1,005,343,240	
මුලු වත්කම්				**2,234,493,762**	**2,146,583,674**
වගකීම්					
ජංගම වගකීම්					
ගෙවීමට ඇති	සේවාදායකයන්ගෙන් ලැබූ මුදල්	9	514,260,662		573,905,412
	ගෙවිය යුතු මුදල්	10	139,177,262	653,437,924	142,911,000
ජංගම නොවන වගකීම්					
දීර්ඝ කාලීන ප්‍රතිපාදන					
	ක්ෂය සඳහා	11	484,490,237		424,538,506
	පාරිතෝශික සහ බොල් ණයකරුවන් සඳහා වෙන්කිරීම්	12	93,534,997	578,025,234	75,823,532
මුලු වගකීම්				**1,231,463,158**	**1,217,178,451**
ශුද්ධ වත්කම්				**1,003,030,604**	**929,405,223**
ශුද්ධ වත්කම් / ප්‍රාග්ධනය					
රජයේ සහ වෙනත් ආයතනවලින් දායක කරන ලද ප්‍රාග්ධනය		13	599,526,190		581,140,713
වෙන්කිරීම් –අතිරික්තය නැවත ගණනය			27,875,989		27,875,989
පවරාගත් වත්කම්			2,264,498	629,666,677	2,264,498
සමුච්චිත අතිරික්තය/ (ඌනතාව)					
	ඉදිරියටගෙන ආ අතිරික්තය	14	318,124,023	318,124,023	254,438,619
වර්ෂය සඳහා අතිරික්තය				55,239,903	63,685,404
ශුද්ධ වත්කම් / ප්‍රාග්ධනය				**1,003,030,604**	**929,405,223**

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය රු.

ආදායම	ඇමුණුම්	2019 වර්ෂය	2018 වර්ෂය
ආදායම			
පාරිසරික අධ්‍යයන සහ සේවා අංශය	15	72,854,502	73,217,949
භූ තාක්ෂණික ඉංජිනේරු සහ පරීක්ෂණ අංශය	16	235,338,251	201,201,699
නායයාම් පර්යේෂණ සහ අවදානම් කළමනාකරණ අංශය	17	273,147,266	389,967,734
මානව ජනාවාස සැළසුම් සහ පුහුණු අංශය	18	97,376,186	120,654,134
ගොඩනැගිලි ද්‍රව්‍ය අංශය	19	40,648,623	44,577,204
ව්‍යාපෘති කළමනාකරණ අංශය	20	186,387,791	155,569,925
ව්‍යාපෘති කළමනාකරණ අංශය		**905,752,619**	**985,188,644**
වෙනත් ආදායම්	21	53,120,424	63,070,505
මුළු ආදායම		**958,873,043**	**1,048,259,150**
අඩුකළා: වියදම්			
වැටුප්, පඩිනඩි හා සේවක ප්‍රතිලාභ	22	538,893,390	465,874,891
භාවිතා කරන සැපයුම් සහ පරිභෝජන	23	326,542,078	479,830,392
ක්ෂයවීම්	24	9,244,961	11,192,661
දේපළ ඌනතා, පිරියත සහ උපකරණ	25	16,333,344	15,747,918
වෙනත් වියදම්	26	12,565,069	9,301,672
මූල්‍ය පිරිවැය	27	54,298	126,212
මුළු වියදම		**903,633,140**	**982,073,746**
බදුවලට පෙර ශුද්ධ ලාභය		55,239,903	66,185,404
ආදායම් බදු			2,500,000
බදුවලට පසු ශුද්ධ ලාභය		**55,239,903**	**63,685,404**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය රු.

	2019	2018
අතිරික්තය / (හිගය) බදු ගෙවීමට පෙර	**55,239,903**	**63,685,404**
ගැලපුම්		
ක්ෂයවීම්	9,244,961	11,192,661
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	19,906,232	8,329,841
පාරිතෝෂික ගෙවීම	-2,194,769	-2,689,899
වාහන අපහරණය	-	0
ගිණුමට බැර නොවූ පොලී ආදායම	-47,177,596	-58,586,910
2016 වසර සඳහා නිවැරදි කිරීම		0
ක්‍රියාකාරී ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර ක්‍රියාත්මක අතිරික්තය (හිඟය)	**35,018,731**	**21,931,097**
ක්‍රියාකාරී ප්‍රාග්ධනයේ වෙනස්වීම්		
ණයගැතියන් වැඩිවීම	-26,611,666	1,188,995
පෙරගෙවීම් වැඩිවීම	-55,791,171	-51,227,325
ඉන්වෙන්ට්‍රිවල වැඩිවීම	-222,667	-379,359
අත ඇති වැඩවල ප්‍රගතිය වැඩිවීම	149,488,457	-5,960,012
තැන්පතු වැඩිවීම	123,680,265	-457,498,895
සේවාදායකයන්ගෙන් ලැබුණු මුදල්	-59,644,750	-114,535,887
විවිධ ණය හිමියන්ගේ වැඩිවීම	-3,733,738	16,464,467
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලැබුණු ශුද්ධ මුදල් ප්‍රවාහය	**162,183,461**	**-590,016,919**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබුණු මුදල් ප්‍රවාහය		
පොලී ආදායම	47,177,595	58,586,910
ස්ථාවර වත්කම් මිලදීගැනීම්	-204,792,239	-159,557,927
ස්ථාවර වත්කම් සඳහා බැහැර කිරීම	1,500,000	
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	**-156,114,644**	**-100,971,017**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය		
රජයේ ප්‍රතිපාදන (ප්‍රසම්පාදන)	21,013,401	25,000,000
වෙනත් ප්‍රතිපාදන	49,578,848	128,874,229
මුදල් යෙදවීමේ ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ	**70,592,249**	**153,874,229**
මුදල් සහ සමාන දෑවල ශුද්ධ වෙනස්වීම	76,661,066	-537,113,707
කාල සීමාව ආරම්භයේ මුදල් සහ සමාන දෑ	40,116,143	577,229,851
2019.12.31 දිනට මුදල් සහ සමාන දෑ	**116,777,209**	**40,116,143**
සටහන- මුදල් සහ සමාන දෑ		
බැංකුවේ සහ අත ඉතිරි මුදල්	116,777,209	40,116,143
	116,777,209	**40,116,143**

ගිණුම් සටහන්

1. ගිණුම් සඳහා වූ පදනම

සාමාන්‍ය පිළිගත් ගිණුම් ප්‍රතිපත්ති, මූලික උපකල්පන, රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිති සහ විටින් විට වරලත් ගණකාධිකාරීන්ගේ ආයතය මගින් හඳුන්වාදුන් ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව සහ පහත සඳහන් කරුණු සැලකිල්ලටගෙන මූල්‍ය ප්‍රකාශන සකස්කර ඇත.

(අ) ලාභ සහිතව පවත්වාගෙනයන ආයතන.

(ආ) ගිණුම් ප්‍රතිපත්ති අඛණ්ඩව භාවිත කිරීම.

(ඇ) උපචිත පදනමින් ආදායම සහ වියදම් හඳුනාගැනීම.

(ඈ) ප්‍රමිතිවලින් බැහැරවීම හෙළි කිරීම

2. සාමාන්‍ය ගිණුම් ප්‍රතිපත්ති

2.1 ක්ෂය කිරීමේ ප්‍රතිපත්ති

(අ) ක්ෂයකිරීම භාවිතා කළ දවස් ගණන මත පදනම් වේ
(ආ) පහත සඳහන් ප්‍රතිශතයන් අනුගමනය කරමින් සරල මාර්ග පදනම් කරගෙන ස්ථාවර වත්කම් ක්ෂය කරනු ලැබේ.

ස්ථාවර වත්කම් වර්ගය	%
ගොඩනැගිලි	2.5
යන්ත්‍රසූත්‍ර සහ විද්‍යාගාර උපකරණ	20
ලී බඩු සහ සවිකිරීම්	10
වාහන	20
සාමාන්‍ය කාර්යාලයීය උපකරණ	20
ඇඳීම සඳහා භාවිත කරන කාර්යාලයීය උපකරණ	10
මෙවලම්	50
පුස්තකාල පොත්	5
ගිනි නිවීමේ උපකරණ	10

(ඇ) ශ්‍රී ලංකාවේ ගණකාධිකරණ ප්‍රමිතිවල සඳහන් පරිදි දායක වත්කම් සඳහා ගෙවීම්, දායක මුදල් ඉදිරියටගෙන ආ වටිනාකමින් අඩුකර ඇත.

2.2 අවසාන තොග ගණනයකිරීම

භාවිත නොකරන ලද භාණ්ඩ තොග පිරිවැය මත ගණනයකර ඇත.

2.3 පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

පාරිතෝෂික පනත අනුව පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන ගණනය කරන ලදී.

2.4 අවිනිශ්චිත ණයකරුවන් සඳහා ප්‍රතිපාදන

පහත සඳහන් කරුණු පදනම් කොට අවිනිශ්චිත ණයකරුවන් සඳහා ප්‍රතිපාදන සපයා ඇත:

(අ) අවු. 2-10 පුරා හිඟ ණය සඳහා 1 % ප්‍රතිපාදන සපයනු ලැබේ.

(ආ) අවු. 10 ක් පුරා හිඟ ණය සඳහා 25 % ප්‍රතිපාදන සපයනු ලැබේ.

Statement of Responsibility for Financial Statements in terms of Sec. 7A.

The Accounting policies & Notes to Accounts on pages 06 form an integral part of these Financial Statements. The Board of Directors is responsible for the preparation and presentation of these Financial Statements. These Financial Statements were approved by the Board of Directors and signed on their behalf.

Member of the Interim Management Committee of NBRO

Kamal Gunaratne WWV RWP RSP USP ndc psc
Major General (Retd)
Secretary
Ministry of Defence
Chairman of the IMC

Major General (Rtd) Kamal Gunaratne
WWV RWP RSP USP ndc psc MPhil
Secretary
Ministry of Defence

H. U. R. Fonseka
Chief Accountant
Disaster Management Division
Ministry of Defence

H. U.R. Fonseka
Chief Accountant
Ministry of Defence
Disaster Management Division
Vidya Mawatha, Colombo 07.

Chief Executive Officer of NBRO

Eng.(Dr.) Asiri Karunawardena
Director General
National Building Research Organisation

Director General
National Building Research Organisation
No. 99/1, Jawatta Road
Colombo 05

Chief Financial Officer of NBRO

K.K.H.Randeny
Director (Finance)
National Building Research Organisation

K.K.H. RANDENY
DIRECTOR FINANCE
NATIONAL BUILDING RESEARCH ORGANIZATION
FINANCE DIVISION
99/1, JAWATTA ROAD,
COLOMBO - 05.

මානව සම්පත් කළමනාකරණය /ධාරිතා සංවර්ධනය

ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ආපදා අවදානම් අවමකිරීමේ අවශ්‍යතා සම්පූර්ණකිරීම සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ ධාරිතාව සංවර්ධනය කිරීමට එහි දැක්ම සහ මෙහෙවර සකස් කරන ලදී. ඒ අනුව කටයුතු කරනු වස්, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ඉහළ ප්‍රමිතියෙන්යුතු සේවයක් සැලසීමට ආයතනීය පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත කිරීමේ ක්‍රියාවලිය සහ කාර්යමණ්ඩල ධාරිතාව ඉහළ නැංවීම සම්බන්ධයෙන් පියවර ගනිමින් සිටියි. ආයතනයේ මානව සම්පත් හා යටිතල පහසුකම් අවශ්‍යතා වර්තමානයේදී ආයතනය විසින් දරනු ලබන වගකීම් කෙරෙහි දැඩි අවධානය යොමු කළ යුතු කරුණකි.

ඉතාම අවශ්‍ය තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා බඳවාගැනීම් සිදුකරන ලදී. 2019 වසරේ දී කාණ්ඩ 6ක් සඳහා සේවකයන් **18** ක් බඳවා ගන්නා ලදී. කාර්යමණ්ඩල සංවර්ධනය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇති අතර ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධාන කාර්යමණ්ඩලයට දැනුම සහ අත්දැකීම් ලබාගැනීමට දේශීය සහ විදේශීය පුහුණු අවස්ථා ඉහළ නංවන ලදී.

අංකය	වැටුප් කේතය	කාර්යමණ්ඩල ගණය	බඳවාගැනීම් සංඛ්‍යාව	දැනට සිටින කාර්යමණ්ඩලය (ස්ථිර)	පුරප්පාඩු ගණන (ස්ථිර)	ලබා ගත හැකි අතිරේක කාර්ය මණ්ඩලය (වෙනත් පදනම්)
1	HM 2- 3	ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ප්‍රධාන විධායක නිලධාරී) (CEO)	1	1	0	0
2	HM 1-3	ජ්‍යෙෂ්ඨ කළමනාකරු	8	7	1	0
3	AR2	ජ්‍යෙෂ්ඨ අධ්‍යයන/විද්‍යාඥ	25	21	4	0
4	MM 1-1	මධ්‍ය කළමනාකරු	12	9	3	1
5	AR 1	අධ්‍යයන/විද්‍යාඥ	124	113	11	44
6	JM 1-1	කණිෂ්ඨ කළමනාකරු	25	24	1	20
7	MA 2-2	කළමනාකරණ සහකාර (තාක්ෂණ)	36	32	4	15
8	MA 1-2	කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	53	45	8	24
9	PL 1,2&3	ප්‍රාථමික	102	89	13	45
	TOTAL		**386**	**341**	**45**	**149**





2019 වසරේ ස්ථිර කාර්යමණ්ඩලය බඳවාගැනීම්, විශ්‍රාම යාම් සහ ඉල්ලා අස්වීම්

අංකය	වැටුප් කේතය	කාර්යමණ්ඩල ගණය	බඳවාගැනීම් සංඛ්‍යාව	ඉල්ලාඅස්වූ සංඛ්‍යාව	විශ්‍රාමලත් සංඛ්‍යාව
1	HM 1- 3	ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ප්‍රධාන විධායක නිලධාරී) (CEO)	-	-	-
2	HM 1-1	ජ්‍යෙෂ්ඨ කළමනාකරු	-	-	-
3	MM 1-1/JM 1-1	මධ්‍ය/ කණිෂ්ඨ කළමනාකරු	6	-	-
4	AR2	ජ්‍යෙෂ්ඨ අධ්‍යයන/ විද්‍යාඥ		-	-
5	AR 1	අධ්‍යයන/ විද්‍යාඥ	10	4	-
6	MA 2-2	කළමනාකරණ සහකාර (තාක්‍ෂණික)	1	2	-
7	MA 1-2	කළමනාකරණ සහකාර (තාක්‍ෂණික නොවන)	-	-	2
8	PL 1,2&3	ප්‍රාථමික	1	1	-
	එකතුව		**18**	**7**	**2**

ජා. ගො. ප. සංවිධානයේ පුහුණු/ වැඩමුළු සහභාගී වීම් / සම්මන්ත්‍රණය ආදිය

ජා. ගො. ප. සංවිධානය සිය කාර්ය මණ්ඩලය සඳහා විවිධ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. කෙටිකාලීන පුහුණු වැඩසටහන්, වැඩමුළු සහ සම්මන්ත්‍රණ සඳහා බොහෝ කාර්ය මණ්ඩල සාමාජිකයින් පිටරට යවන ලදි. සමහර විද්‍යාඥයන් විදේශයන් හි මාස්ටර් වැඩසටහන් සඳහා තෝරා ගන්නා ලදී.

2019 විදේශ පුහුණු වැඩසටහන්

No	Participants	Designation	Division	Training Information	Period	Country
1	Mr.S.O.A.D.M.Lakruwan	Scientist	LRRMD	JICA Long term training program for Disater Risk Reduction (DRR) to Implement the Sendai Framework (FY2019)	27.09.2019 05.10.2022	Japan
2	Mr.P.H.C.S.Rathnasiri	Senior Scientist	HSPTD	Urban & Reginal Development Post - Master Retraining Program	19.01.2019 - 02.02.2019	Seoul, Korea
3	Dr. P.Jayasinghe	Senior Scientist	LRRMD	IORA Cluster Group on Disaster Risk Management (DRM)	05.02.2019 - 06.02.2019	New Delhi, India
4	Dr. P.Jayasinghe Mr. L.U.M.Kankanmge	Senior Scientist Scientist (Eng.)	LRRMD GETD	Knowledge Sharing Workshop & Stud	06.02.2019 - 11.02.2019	Thailand
5	Mr. W.K.S.M.Wakwella	Scientist (Geologist)	LRRMD	Rapid Assessment for Resilient Recovery (RARR)	29.01.2019 - 01.02.2019	Gujarat, India
6	Mr. C.S.Menikpura	Senior Scientist	LRRMD	Knowledge Co- creation Program Disaster Risk Reduction & Management (Singapore & Japan)	03.03.2019 - 09.03.2019 in sigapore 09.03.2019 - 16.03.2019 in japan	Singapore & Japan
7	Eng.(Dr) Asiri Karunawardena Mr. R.M.S. Bandara	Director General Director	LRRMD AIIB	Reduction of Landslid Vulnerability by Mitigation Measures Project - Loan Negotiation	21.02.2019 - 22.02.22	China
8	Eng.(Dr) Asiri Karunawardena Mr. R.M.S. Bandara	Director General Director	LRRMD AIIB	Third South Asia Regional South - learning workshop on " Strengthening Geohazard Risk Management in Transport"	29.04.2019 - 02.05.2019	New Zealand
9	Mr. N.KW.A.M.M.K.N. Bandara Mr. R.M.B. Somarathna	Director General Sr.Scientist	GETD LRRMD	Japan under JICA prepartary survey on Landslide Disaster Protection of the National Road Network Phase - 2	07.05.2019 - 14.05.2019	Japan
10	Dr. H.A.G.Jayathissa Mr.H.M.L. Indrathilaka , Mr.S.M.S. Aroos, Mr.E.I.Jayasekara	Act. Director Scientist	LRRMD	7th International Conference on " Debris Flow Hazard Mitigation	08/06/2019 - 18/06/2019	USA

10	Dr. H.A.G.Jayathissa Mr.H.M.L. Indrathilaka , Mr.S.M.S. Aroos, Mr.E.I.Jayasekara	Act. Director Scientist	LRRMD	7th International Conference on " Debris Flow Hazard Mitigation	08/06/2019 - 18/06/2019	USA
11	Mrs. H.D. Kumarapeli	Scientist	ESSD	Training program for Researchers on 'Asbastos Fiber Ditermination in Russian Research Institute of Mineral Raw Materials"	27/05/2019 - 01/07/2019	Russia
12	Mrs. G.D.W.N.Galhena	Scientist (Eng.)	GETD	Training program on " Disaster Management for Sediment related Disasters (Landslide, Debris flow, Flash Flood & Volcanic Mudflow)	09/06/2019 - 13/07/2019	Japan
13	Dr. H.A.G.Jayathissa Mrs. E.J.M.P.H. Jayasundara	Act. Director Scientist	LRRMD	Invitation to attend the International Conference on "Silk - roads Disaster Risk reduction & sustainable Development"	11/05/2019 - 17/05/2019	China
14	Dr. Asiri Karunawardhana Mr.K.C. Sugathapala	Director General Director	General HSPTD	BRCA Worshop in Maldives	15/07/2019 - 16/07/2019	Maldives
15	Mr. R.M.S.A.K. Rathnayaka	Scientist	LRRMD	"Early Warning System for National Disasters"	22.08.2019 - 11.09.2019	Korea
16	Mrs. A.D.H.J.Perera	Scientist	LRRMD	Master Degree Program in "Environmental Science in University of Tsukuba, Japan from 21st August to October 2021.	21st August - 2021 October	Japan
17	Dr. Wasantha Senadheera Mr. Dhanushka Jayathilaka Mr. D.I.U. Jyawardhana Mr. Jayaprakash Selvaraj Mr. D.M.L Bandara	Scientist	LRRMD HSPTD	Counterpart Training Under the JICA Technical Cooperation Project for " Capacity Strengthening on Development of Non – structural Measures for Landslide Risk Reduction " in Sri Lanka – (TCLMP 2) from 1st to 14th September 2019.	1st to 14th September 2019.	Japan
18	Mr. P.H.C.S. Rathnasiri	Senior Scientist	HSPTD	Subject: Letter of Invitation to be a panelist at Re – Naturing through Nature Based Solutions for a Resilient Future"	3rd September 2019	Bangkok, Thailand
19	Mr. N.W.A.M.M.K.N. Bandara Mr. H.D.S. Premasiri	Director (Technical) Senior Scientist	GETD ESSD	Study Tour to South Korea- Nanjido and Sudukoan Eco Park Project	from 16th September 2019 to 22nd September 2019.	South Korea
20	Ms. M. S. N. De Zoysa Mr. P.G.D.S. Jayawickrama	Scientist	LRRMD HSPTD	2019 Seminar on "Disaster Response & Risk Management For Sri Lanka"	16th October to 5th November 2019,	China
21	Eng.Dr. Asiri Karunawardena	Director Genaral		12th Asia Oceanic Group on Earth Observations (AOGEO 2019) Symposium	31.10.2019 - 08.11.2019	Canbera, Australia
22	Dr. H.A.G.Jayathissa	Act. Director	LRRMD	Second South Asia Regional Hydromet Forum (SAHF II)	18.11.2019 - 22.11.2019	Nepal.
23	Dr. H.A.G.Jayathissa	Act. Director	LRRMD	International Symposium on "Disaster Risk Reduction"	12.12.2019 - 16.12.2019	China

උපකරණ ප්‍රසම්පාදනය

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ පර්යේෂණ කටයුතුවල ධාරිතාව වර්ධනය සඳහා, විද්‍යාගාර සහ ක්ෂේත්‍ර උපකරණ ප්‍රසම්පාදනය සඳහා 2019 වසරේදී මහා භාණ්ඩාගාරය විසින් සපයන ලද රු. මි. 20.0 කාර්යක්ෂම ලෙස භාවිත කරන ලදී. මෙම ප්‍රතිපාදන යටතේ ක්ෂේත්‍ර උපාංග සහ වැදගත් තොරතුරු තාක්ෂණික උපකරණ ඇතුළු ප්‍රධාන උපකරණ මිලදී ගන්නා ලදී. එසේ ප්‍රධාන වශයෙන් මිලට ගත් උපකරණ පහත දැක්වේ.

අංශය	අයිතමය
ගොඩනැගිලි ද්‍රව්‍ය පර්යේෂණ හා පරීක්ෂණ අංශය	ඩිජිටල් බන්ධන ශක්තිය පරීක්ෂකය, පයික්නෝමීටරය, උෂ්ණත්ව සංවේදක සහිත ක්ලෝරයිඩ් ඒකාබද්ධ ඉලෙක්ට්‍රෝඩ, දියමන්ති කොන්ක්‍රීට් කුහර විදුම් හිස, ඉලෙක්ට්‍රොනික (උත්ප්ලාවකතා) තරාදි, ඩයල් මානක, ඩයල් මානක රැඳවුම්, විද්‍යුත් චුම්භක සෙලවුම් පෙරණය, පීඑච් මීටරය, තාප විද්‍යුත් යුග්ම සහිත ඩිජිටල් උෂ්ණත්වමානය
පාරිසරික අධ්‍යයන හා සේවා අංශය	ඩිජිටල් උෂ්ණත්වමාන, පර්යේෂණාගාර සෙලවුම් පෙරණය, අතිධ්වනික ජල බේසම, වායු කම්පක, නියැදිකරණ පොම්ප, පෙරහන් රඳවන, ඇසිටෝන් වාෂ්ප ජනකය, වායු පවිත්‍රකාරකය
මානව ජනාවාස සැලසුම්කරණය හා පුහුණු අංශය	3-d මුද්‍රණ යන්ත්‍රය, රිබවුන්ඩ් මිටිය, ස්වයංක්‍රීය ලෙවලය, ආලෝකය සහ ශ්‍රව්‍ය දෘශ්‍ය ඩිජිටල් සම්බන්ධක, ඩුප්ලෝ යන්ත්‍රය
භූ තාක්ෂණික ඉංජිනේරු හා පරීක්ෂණ අංශය	DCPT උපකරණ, මැකින්ටොෂ් උපකරණ, ද්‍රව සීමිත උපාංගය, ට්‍රයිඇක්සියල් යන්ත්‍ර සඳහා දත්ත සම්පාදක, බ්‍රෙන්ටන් මාලිමාව, ජීපීඑස්, ලෙවල, භූ තාක්‍ෂණික සිතියම්කරණ මෘදුකාංග, කුහර හිස්, ඩිප් මාපක,
නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමනාකරණ අංශය	මාලිමා, මිටි සහ මිනුම් පටි
ව්‍යාපෘති කළමනාකරණ අංශය	SLR කැමරා - 3 යි.

2019 වර්ෂය සඳහා වූ විගණන වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඩීඑම්සී/ඒ/එන්බීආර්ඕ/එෆ්එස්/2019/08

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2020 ජූලි 09 දින

අධ්‍යක්ෂ ජනරාල්,

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රසිද්ධ කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) අඩමාන ණය වෙන්කිරීම සඳහා වූ සංවිධානයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව වසර 10 කට වඩා වැඩි ණය ශේෂය වෙනුවෙන් සියයට 25 ක් අඩමාන ණය සඳහා වෙන් කළයුතු වුවද වසර 10 ඉක්ම වූ රු.මිලියන 5.55 ණය ශේෂ වෙනුවෙන් රු.මිලියන 1.39 ක අඩමාණ ණය සඳහා වෙන් කිරීම් කර නොතිබුණි.

(ආ) සංවිධානය ද සම්බන්ධවී ක්‍රියාත්මක කරනු ලබන "ස්ථාවර කිරීමේ ක්‍රමවේදය මගින් අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති" කාර්යාලය පවත්වාගෙන යාම සඳහා ගොඩනැගිලි කුලියට ලබාගෙන නොතිබුණු නමුත් එම ව්‍යාපෘතියට දරන ලද වියදමක් ලෙස රු.මිලියන 1.81 ක් සංවිධානයේ ගොඩනැගිලි කුලියෙන් අඩුකර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.මෙම නිසා සමාලෝචිත වර්ෂයට අදාල ගොඩනැගිලි කුලිය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි 48 වන ඡේදයට අනුව ආදායම් හා වියදම් එකිනෙකට හිලව් නොකළ යුතු වුවද, එකතුව රු.මිලියන 27.87 ක් වූ වෙනත් වියදම් ශේෂයට පර්යේෂණ හා සංවර්ධන කටයුතු වෙනුවෙන් මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු රු. මිලියන 15.31 ක මුදල හිලව් කර වෙනස වූ රු.මිලියන 12.56 ක මුදල පමණක් වෙනත් වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 1 හි 76 ඡේදයට අනුව වර්ෂයක් ඇතුළත උපලබ්ධි කර ගැනීමට අපේක්ෂිත වත්කම් ජංගම වත්කම් යටතේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්විය යුතු වුවද, වර්ෂයකට වැඩි කාලයක් සඳහා ආයෝජනය කර තිබුණු සංවිධානයේ රු. මිලියන 463.89 ක් වූ ස්ථාවර තැන්පත් වටිනාකම් ජංගම වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) පර්යේෂණ සංවිධානයේ දිස්ත්‍රික් කාර්යාලවලින් ප්‍රධාන කාර්යාලය වෙත ප්‍රේෂණය කර තිබුණු රු.මිලියන 1.52 ක් අදාල ගිණුම් වලට ගලපනු වෙනුවට ජංගම වගකීම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 15 අනුව සංවිධානයේ අයවැයගත තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

2

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

3

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

4

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ පවත්වාගෙන ගොස් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

5

	නීති,රීති /විධානයට යොමුව	විස්තරය
(අ)	2013 ඔක්තෝබර් 09 දිනැති අංක 21/2013 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සංශෝධිත ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ 10.1 වගන්තිය	මසකට දින 2 කට වැඩියෙන් සති අන්ත සහ රජයේ නිවාඩු දින වල නිලධාරීන් සේවයේ යොදවා ගෙන ගෙවීම් කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගත යුතුය. එසේ වුවත් එම අනුමැතිය ලබාගැනීමකින් තොරව දින දෙකකට වැඩියෙන් සේවය කල නිලධාරීන් සඳහා රු.මිලියන 6.13 ක් ගෙවා තිබුණු අතර මෙම ගෙවීම් මත පදනම්ව සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල වෙත එකතුව මුදල රු.918,920 ගෙවීමද සිදු කර තිබුණි.
(ආ)	ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ 7 වගන්තිය	අතිකාල දීමනා ගෙවිය හැකි ශ්‍රේණිවල නිලධාරීන් සඳහා මසකට පැය 20 ක කාලයක් සඳහා අතිකාල ගෙවිය හැකි වුවත්, එම උපරිමය කාලය ඉක්මවා අතිකාල ගෙවීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගත යුතුවේ. එසේ වුවත් උපරිම සීමාව ඉක්මවා තිබුණු අතිකාල අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා නොගෙන ගෙවා තිබුණි.
(ඇ)	2016 අප්‍රේල් 04 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 13.2 ඡේදය	ආයතන සංග්‍රයේ VIII පරිච්ඡේදයේ 6.1 උපවගන්තියේ සඳහන් විධිවිධාන වලට පටහැනිව අතිකාල පැයකට ගෙවිය යුතු දීමනාව තිරණය කර අතිකාල ගෙවීම නිසා 2019 වර්ෂයේදී අතිකාල දීමනා ලෙස රු. මිලියන 8.83 ක් සහ ඊට අදාළ සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට එකතුව රු.මිලියන1.32 ක් සංවිධානය විසින් වැඩිපුර ගෙවා තිබුණි.
(ඈ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 104	තොග පාලනයේ සිදු වී ඇති අක්‍රමිකතා හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට භෞතික තොග වටිනාකම හා තොග පාලන ගිණුමේ ශේෂය අතර රු. 400,824 ක වෙනසක් නිරීක්ෂණය විය. මෙකී පාඩුව පූර්ණය කරගැනීමට මෙම රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

6

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) උපවගන්තිය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ බලතල, කර්තව්‍ය හා කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව,

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) උප වගන්තිය වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) පර්යේෂණ සංවිධානය විසින් ඉදිකරමින් පවතින නව කාර්යාල හා විද්‍යාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව පිළිගත හැකි සාධාරණ හේතුවක් නොමැතිව දින 623 ක අතිරේක කාලයක් ලබාදී තිබුණ අතර දින 162 ක කාලය වෙනුවෙන් ප්‍රමාද ගාස්තු ලෙස රු.මිලියන 1.62 අයකර ගෙන නොතිබුණි. කොන්ත්‍රාත්තුවේ ප්‍රමාණ පත්‍රිකා වල වූ වැඩ විචලනයන් වෙනුවෙන් රු.මිලියන 43.12 ක් ගෙවා තිබුණ ද ඒ සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශ ලේකම් ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. ගොඩනැගිල්ල ඉදිකිරීම ප්‍රමාද වීම හේතුවෙන් සංවිධානයේ අංශ කිහිපයක් පවත්වාගෙන යාම සඳහා කුලියට ලබාගෙන තිබුණ ගොඩනැගිලි සඳහා බදු කුලී සහ ආරක්ෂක සේවා වෙනුවෙන් 2019 වර්ෂයේදී රු. මිලියන 6.36 ක් සහ ඉදි කිරීම් කටයුතු හා සම්බන්ධ සංවිධානයේ නිලධාරීන්ගේ දායකත්වය වෙනුවෙන් රු. මිලියන 9.60 ක් අතිරේකව ගෙවා තිබුණි.

(ආ) ප්‍රධාන කාර්යාලය වෙත වාහන සපයා ගැනීම සඳහා ලංසු කැඳවීමේදී අවම ලංසු මිල ඉදිරිපත් කර තිබුණ ආයතනය අසාධු ලේඛන ගත කළ ආයතනයක් බවට සාවද්‍ය ලෙස කරුණු දක්වා එම ආයතනය ඇගයීමෙන් ඉවත්කර වෙනත් ආයතනයක් වෙත කොන්ත්‍රාත්තු පිරිනැමීම හේතුවෙන් වාර්ෂිකව රු.මිලියන 5.47 ක අතිරේක වියදමක් දැරීමට සංවිධානයට සිදුවී තිබුණි. එසේම දිස්ත්‍රික් කාර්යාල වෙත වාහන සපයන ආයතනයෙන්ම මාසික කුලිය රු. 132,000 ගෙවීමට ලබාගෙන තිබුණ කැබ් රථයක සේවය නවතා ප්‍රධාන කාර්යාලය වෙත වාහන සපයන ආයතනයෙන් මාසික කුලිය රු. 185,000 ක් ගෙවීමට කැබ් රථයක් ලබාගෙන තිබුණ අතර ඒ වෙනුවෙන් වාර්ෂිකව රු.636,000 ක් ද අතිරේක ගෙවීමක් කිරීමට සංවිධානයට සිදුවී තිබුණි.

7

3. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) පර්යේෂණ සංවිධානය සඳහා නීතිමය තත්ත්වය ප්‍රදානය කිරීම වෙනුවෙන් පනතක් පිළියෙල කිරීම සඳහා ඉදිරිපත් කර තිබුණු අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2010 ජුනි 02 දින අනුමැතිය ලැබී තිබුණු අතර ඒ අනුව පිළියෙල කළ පනත් කෙටුම්පත 2012 සැප්තැම්බර් 10 දින නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමුකර තිබුණි. කෙසේ වෙතත් අදාළ පනත 2019 දෙසැම්බර් 31 දින වනතුරුත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පුස්සල නවෝද්‍යා විද්‍යාලයේ සහ බදුල්ල වැවේගම රෝහල් පරිශ්‍රයේ සිදු කළ නාය යැම් අවම කිරීමේ ව්‍යාපෘති සම්බන්ධ ඉදිකිරීම් කොන්ත්‍රාත් ලබාගෙන තිබූ කොන්ත්‍රාත්කරුවන් 2016 වර්ෂයේදී කොන්ත්‍රාත්තු කටයුතු අත්හැර දමා තිබුණි. සංවිධානය වෙත සිදු වූ අලාභයන් ආවරණය කර ගැනීම සඳහා එම කොන්ත්‍රාත්කරුවන් විසින් ලබාදී තිබුණු අත්තිකාරම් ඇපකර වලින් රු.මිලියන 1.66 ක් ද එම ව්‍යාපෘතිවල කාර්‍යසාධන ඇපකර වලින් වූ රු.මිලියන 1.57 ක් ද 2019 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී මහා භාණ්ඩාගාරයෙන් පර්යේෂණ සංවිධානය වෙත රු. මිලියන 200 ක් ලබා දී තිබුණි. එම මුදලින් රු. මිලියන 35 ක් උක්ත කරුණට අදාළ නොවූ විශේෂ භූමි පරීක්ෂණ කටයුතු සඳහා උපයෝජනය කර තිබුණි. එයින් ඉතිරි රු.මිලියන 165 උපයෝගී කරගෙන ව්‍යාපෘති 8 ක් ඉටු කිරිමට රු.මිලියන 160.18 ක ඇස්තමේන්තුවක් සකස් කර රු.මිලියන 132.92 ක වටිනාකමකට කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. 2020 පෙබරවාරි 28 දින වන විට මෙම ව්‍යාපෘති 08 හි ඉදිකිරීම් අවසන් කළයුතු වුවත් එම කටයුතු අවසන් කර නොතිබුණි.

(ඈ) කඩුවෙල සිට හංවැල්ල දක්වා කැලණි ගං ඉවුර දෙපස මූලික භූතාක්ෂණික පරීක්ෂාවක් සිදුකිරීමේ කොන්ත්‍රාත්තුවක් සංවිධානය වෙත ලැබී තිබුණ අතර ඊට අදාළ කෝන්පෙනට්‍රේෂන් ටෙස්ට් සිදුකිරීමේ කාර්යයන් ඉටුකර ගැනීම සඳහා සීමිත ලංසු කැඳවීම මඟින් උපකොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගෙනතිබුණි. ලංසු කැඳවීම සඳහා ආයතන තෝරා ගැනීම සහ ලංසු විවෘත කිරීම විනිවිදභාවයෙන් සිදුකර නොතිබුණ අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4(ඇ) වගන්තිය ප්‍රකාරව බාහිර සමාජිකයකු තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා පත්කර නොතිබුණි. මේ සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 වගන්තිය ප්‍රකාරව කාර්යසාධන ඇපකරයක් ලබාගෙන නොතිබුණ අතර එකඟ වූ කොන්ත්‍රාත් වටිනාකමට අතිරේකව රු.මිලියන 1.4 ක් ගෙවා තිබුණි.

8

(ඉ) ප්‍රජා මූලික ආපදා අවම කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සහ නායයෑම් විස්ථාපන හඳුනාගැනීමේ පද්ධති වෙනුවෙන් 2015 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් ලැබී තිබුණු රු.මිලියන 7.62 ක් 2019 දෙසැම්බර් 31 දින වන විටත් අදාල කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබූ අතර නායයෑම් අවදානම් අවම කිරීමේ අංශය වෙත 2015 වර්ෂයේදී මහා භාණ්ඩාගාරයෙන් ආංශික ආකෘති වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ලැබී තිබුණ රු.මිලියන 5 ක මුදල 2019 දෙසැම්බර් 31 දින වන විටත් උපයෝජනය කර නොතිබුණි.

(ඊ) 2009 වර්ෂයේ සිට සංවිධානයේ මූල්‍ය ප්‍රකාශනවල නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු රු.මිලියන 5.92 ක ශේෂයක් අඛණ්ඩව දක්වා තිබුණ ද , අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ශේෂයක් වශයෙන් එම වටිනාකම දක්වා නොතිබුණු බැවින් එම මුදල අයකර ගැනීම අවිනිශ්චිතව පැවතුණි. එසේම සංවිධානය වෙත අයවිය යුතුව ඇති ටෙන්ඩර් ඇප තැන්පතු රු. 575,722 ක් සහ නායයෑම් අවදානම් තක්සේරු වාර්තා නිකුත් කිරීම වෙනුවෙන් ප්‍රාදේශීය සභාවලින් අයවියයුතු රු. 477,882 ක් 2019 දෙසැම්බර් 31 දින වනවිටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ටෙන්ඩර් ඇප තැන්පත් ලෙස ලබාගෙන තිබුණ රු. 991,152 ක් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඌ) ණය පදනම් මත සේවා සැපයීම සංවිධානයේ ප්‍රතිපත්තිය නොවූවද, පරිසර අධ්‍යනය සහ සේවා හා භූ තාක්ෂණික සහ ඉංජිනේරු යන අංශ දෙක මගින් සමාලෝචිත වර්ෂයයේදී ණයට සේවා සැපයීම වෙනුවෙන් 2019 දෙසැම්බර් 31 වන විට පිළිවෙලින් රු. මිලියන 4.08 ක් සහ රු.මිලියන 23.14 ක් අයවිය යුතුව තිබුණි. 2018 හා 2019 යන වර්ෂ දෙකට අදාළව රු. මිලියන 37.50 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(එ) සංවිධානය මගින් සකස්කර තිබුණු ජාතිය ගොඩනැගීමේ බදු වාර්තාවන්ට අනුව 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බද්ද රු.මිලියන1.12 ක් වුවද සංවිධානයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව එම බද්ද දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගෙන් අයකරගතයුතු බද්දක් ලෙස රු.මිලියන 2.54 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම සංවිධානයේ එකතුකළ අගය මත බදු වර්තාවන්ට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රතිපූර්ණය කරගතහැකි එකතු කළ අගය මත බදු වටිනාකම රු.මිලියන7.31 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව එම අගය රු.මිලියන 10.06 ලෙස දක්වා තිබුණි.

9

(ක) 2019 දෙසැම්බර් 31 දිනට සංවිධානයේ අනුමත කාර්ය මණ්ඩලය නිලධාරීන් 386 ක් වුවද සේවයේ නියුතු එනම් කාර්ය මණ්ඩලය 459 ක් විය. මෙයින් සේවකයන් 117 ක් ස්ථිර කාර්ය මණ්ඩලයට අයත් නොවන නිලධාරීන් වන බව අනාවරණය විය.

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න

විගණකාධිපති

10

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
99/1, ජාවත්ත පාර, කොළඹ 5
දු. ක.: **011-2588946, Fax: 011-2502611**
විද්‍යුත් තැපැල **:nbro@sltnet.lk,** වෙබ් අඩවිය **: www.nbro.gov.lk**